

# මූලූසික සන්නයං

# MULUSIKA SANNAYA.

## මූලූසික සන්නය.

අරියවංසධජ උඩුවර

ශ්‍රී පඤ්ඤාජෝති තිස්ස ස්ථවිරයානන්

වහන්සේ විසින්

සමාදරයෙන් පිළිගන්නා ලදී.

---

ලංකාණ්ඩුවේ පොලිස් දෙපාර්තමේන්තුවෙන්

අවසරලත්

ප්‍රසිද්ධ බෞද්ධදේශනාකාර

**පී. ටී. ඇස්. ධර්මවර්ධන සහ**

**ජූ. ඩබ්ලිව්. සියකුලරත්න**

යන අප විසින්

අලුත්ගම සද්ධර්මප්‍රකාශ යන්ත්‍රාලයෙහි

මුද්‍රනය කරන ලදහ.

---

ශ්‍රී බුද්ධවර්ෂ 2468.

ක්‍රිස්තුවර්ෂ 1924.

# ශුද්ධි පත්‍රයං

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 1 | 13 | පවෙසනඪතුඩාර | පවෙසනඝිතුඩාර |
| 1 | 16 | පවෙනනඝිතුඩාර | පවෙසනඝිතුඩාර |
| 2 | 9 | පරාජිකා | පාරාජිකා |
| 2 | 13 | පරාජිකා නිතද්දසො | පාරාජිකා නිද්දෙසො |
| 2 | 29 | විමොචය | විමොචයං |
| 2 | 34 | රාමගත | රාගෙන |
| 3 | 3 | කායසපශීරාහයෙන් | කායසපශීරාගයෙන් |
| 3 | 11 | මෛථුනංවා | මෙථුනංවා |
| 4 | 22 | තිවිවර | තිචිවර |
| 4 | 28 | පුරාර | පුරාණ |
| 4 | 29 | සිය | සියා |
| 4 | 33 | ගෝ | හෝ |
| 5 | 5 | චිවරදුනෙ | චීවරාදුනෙ |
| 5 | 6 | නියගි | නිසගි |
| 5 | 14 | ඝණ්ඨයයවා | ගණ්ඨයයවා |
| 5 | 16 | මාසකංචා | මාසකංවා |
| 5 | 17 | | ගණ්ඨයයවා තමාපිණීස අනුන් ලවා ගන්නවාතම් හො |
| 6 | 2 | සිය | සියා |
| 6 | 4 | පතෙසති | පතොතසති |
| 6 | 13 | තස්ස | තස්ස |
| 7 | 8 | පෙසුස්සැ | පෙසුස්සැ |
| 7 | 9 | | ගෙතයාම |
| 7 | 17 | අනුපසම්පතෙනන | අනුපසම්පනෙන |
| 8 | 2 | අභිඤ්ඤුනො | අභිකඛුනො |
| 9 | 27 | | දන්තකඨොදකංවිනා දැහැටිපැන් හැර අප්පටිග්ගහිතං නොපිළිගත් දෙයක් භුඤ්ජෙ අනුභවකොරේ නම් (ඔහට පචිති ඇවැත්වෙයි) |
| 9 | 30 | සහජ්ජකො | සහජ්ජතො |
| 10 | 34 | හතෙනහිකඛු | හනෙහිකඛු |
| 11 | 3 | ප්‍රාණං | පානං |
| 11 | 10 | ගමන්තර | ගාමන්තර |
| 11 | 15 | පගරතොචාපි | පහරතොවාපි |
| 11 | 16 | හටට | හටද |
| 11 | 26 | පිණ්ඩනජාතානං | භණ්ඩනජාතානං |
| 12 | 22 | (නස්වචීවර) | (නස්ටචීවර) |
| 13 | 3 | රඤ්ඤ | සඤ්ඤ |
| 13 | 14 | අනුපුවජ්ජිත | අනාපුච්ජිත |
| 13 | 25 | තිකඛි | තිකඛ |
| 13 | 33 | කෙවර්තම් | කෙරේනම් |
| 14 | 6 | උද්දිසෙ | උද්දිසෙ |
| 14 | 19 | භොහනාදිකං | භොජනාදිකං |
| 14 | 28 | කුඩෙඩිත | කුණ්ඩඩඵමෙබිත |
| 15 | 1 | අස්සැස්සැමිස්සැස්සැස්සැව | අස්සැස්සැමස්සැස්සැස්සැව |
| 15 | 10 | නිම්තනයං | නිම්තනං |
| 16 | 15 | ගමන්සීමාදිං | ගන්සීමාදිං |

# විඥාපනය.

## මූලසික සන්නය.

ශ්‍රී ලඞ්කාද්වීපවාසී ජිනශාසන ප්‍රතිපත්ති පරිපූර්ණාභිලාෂී ප්‍රියශීලී භික්ෂූන් වහන්සේලාගේ හස්තසාර වස්තුවක් සමානවූ මේ මූලසික්ෂා (මූලසික) නාමොපලක්ෂිත කුඩා විනය ප්‍රකරණය අසවල් කාලයෙහි අසවල් ආචාර්යයන් වහන්සේ විසින් රචනා කරණ ලද්දේයයි ප්‍රකාශකිරීමට කාරුණු ග්‍රන්ථාරම්භ නිගමන යන්හි හෝ වෙන ඉතිහාසාදියක හෝ අප විසින් නොදක්නාලද බැවින් කර්තෘ සන්දර්ශනාදිය ගැණ නොපොහොසත් නමුත් ශාස්ත්‍රාගමධාරී විනයනය ප්‍රවීණ පටුතර බුද්ධිමත් මහාස්ථවිරයන් වහන්සේ කෙනෙකුන් විසින් ආධුනිකොපසම්පන්න භික්ෂූන් වහන්සේලාට ප්‍රඥප්ති කඩනොකොට මනාසේ පිළිවෙත් පිරීම පිණිස වහා දැනගතයුතු ශික්ෂාපද පමණක් අනාගීතකොට රචනාකරණලද පුරාතන විශිෂ්ට ග්‍රන්ථයක් බව හැඟේ. මෙහි පෞරාණිකත්වය පැරණි සන්නයෙහි වාග්විලාසයෙන් හා ටීකා මතයෙන්ද ඔප්පුවේමය.

මෙයින් අවුරුදු 30 කට පමණ පෙර රාමඤ්ඤනිකායේ දශවර්ගික කාරක සඞ්ඝ සභායානනාගීත ධර්මවිනයාති දක්ෂ ශික්ෂාකාමී ශ්‍රී සඞ්ඝාචාර්ය ඤාණින්දසභ මහාස්ථවිරපාදයන්වහන්සේ විසින් ටීකානයානුගතව මීට ලියනලද සන්නය බෞද්ධ මහතුන් දෙදෙනෙක් විසින් මුද්‍රනය කරවා භික්ෂූන්ගේ හස්තප්‍රාප්ත කිරීමෙන් බොහෝ ප්‍රයෝජනවත්වූ නමුත් දැනට එය අවසානවී පොත දුර්ලභ හෙයින් සුලභකිරීම කාලොචිත ශාසනසංග්‍රහවකැයි බොහෝදෙනාගේ ඉල්ලීම පිට මුල්ලේපිටියේ සුවර්ණබිම්බාරාමාධිපති සිරිසුගත සාසන වංසපාල ගණාචාර්ය අරියවංස තිලක මෙධාවි තිස්සාභිධාන නායක ස්ථවිරපාදයන් වහන්සේගේ ආචාර්යවූ වස්කඩුවේ ක්ෂේත්‍රාසන්න විහාරාධිපතිව වැඩවිසූ සිරි සුගත සාසනධජ විනයාචරිය ශ්‍රී ධීරක්ඛන්ධ නායක මහාස්ථවිරපාදයන්වහන්සේ විසින් ලියනලද සන්නයද ඇසුරුකොට

යථොක්ත නායක ස්ථවිරපාදයන් වහන්සේගේ ශිෂ්‍යවූ වැලිතොට විද්‍යාභාෂා විද්‍යාලයෙහි ශාස්ත්‍රාද්ග්‍රහණය කළ මූල්ලේපිටියේ **ධම්මජෝති තිස්ස ස්වාමීන්වහන්සේ** ලවා සකස්කරවා, ගණ පහන නම් පෙණෙන අපවිසින් මෙය මුද්‍රණයකරවන ලදුහ.

විනයෙ ඨිතෙ සාසනං ඨිතං හොති. යන්නෙන් විනය පිටකය පවත්නා කලැ බුද්ධශාසනය පවතිනේවේයයි විනයෙහි දක්වා තිබෙන බැවින් සියලු සැදැහැවතුන් විසින් එක එක පොත රැගෙණ තමතමන්ගේ කුලූපග භික්ෂූන් වහන්සේලාට පරිත්‍යාග කිරීමෙන් සික්ෂා සංරක්ෂණයෙහි ප්‍රොත්සාහීවනබැව් සලකා ධර්මදානමය මහාපුණ්‍යකර්මය සිදුකරගැණීමෙන් ස්වර්ග මොක්ෂ සම්පත් ප්‍රාර්ථනාකටයුතු බවද සිහිපත්කරවමු.

මෙහි ප්‍රමාද දොෂ ඇතොත් සුධීහු සුඛ කොරෙත්වා.

එහැර විශෙෂයෙන්ම දන්වන්ට තිබෙන්නේ පැරණි සන්න සත් ඇසුරුකොට මේ මූලසික සන්නය ලිඛිත මූල්ලේපිටියේ **ධම්මජෝති ස්වාමීන්වහන්සේට** වැළඳුන බලවත් ආබාධයක් නිසා වෛද්‍යවරයන්ගේ ඇරයුම පරිදි ගිහිවී දැනට ඉංග්‍රීසි ආණ්ඩුවේ පොලිස්දෙපාර්තමේන්තුවෙන් ලබනලද අවසරපත්‍ර ඇතිවැ ලක්දිව සෑම පළාත්වලම නොමිළයේ දෙශණාකරමින් ලොසතුන් දෙකට මහෝපකාරීව වෙසෙන බැව් හිතාධ්‍යාසයෙන් මතක්කරම්හ—

මීට,

යූ. ඩබ්ලිව්. සියකුලරත්න.

# මූලසික්ඛා සන්නය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

1 නත්වානාථං පවක්ඛාමි මූලසික්ඛං සමාසතො
භික්ඛුනා නවකෙනාදෙ මූලභාසාය සික්ඛිතුං–

1 නාථං,(යාචන උපතාප ඉස්සරිය ආසිංසන යන චතුර්විධ නාථාර්ථයෙන් යුක්තවූ) භාග්‍යවතුන්වහන්සේට; නත්වා; කාය වචී මනොද්වාරයෙන් සකසා නමස්කාරකොට; ආදෙ, ආදියෙහි; නොහොත් උපසම්පන්නවූ තැන්පටන්; නවකෙන භික්ඛුනා, අලුත මහළු පැවිදිලත් භික්ෂුව විසින්; සික්ඛිතුං, හික්මෙනු පිණිස; මූල භාසාය; මූලභාෂා නම්වූ මාගධභාෂාවෙන්; මූලසික්ඛං, අධිශීල අධිචිත්ත අධිප්‍රඥායයි කියනලද ත්‍රිවිධ ශික්ෂාවන්ට මුල්වූ බැවින් මූලසික්ෂා නම්වූ) අධිසීල සික්ෂාව; නොහොත් තදදීපකවූ ග්‍රන්ථය; සමාසතො, සංක්ෂෙපයෙන්, පවක්ඛාමි, ප්‍රකාරයෙන් කියමි–

2 සන්නිමිත්තං පවෙසෙන්තො භික්ඛු මග්ගත්තයෙ චුතො
පවෙසනඨිතුද්ධාර පවිට්ඨෙ චෙපි සාදියං—

2 සන්නිමිත්තං, තමන්ගේ නිමිත්ත; මග්ගත්තයෙ; මාර්ගත්‍රිකයෙහි; පවෙසෙන්තො, ප්‍රවේශකරන්නාවූ; භික්ඛු, මහණතෙම; පවෙසනඨිතුද්ධාර පවිට්ඨෙ, ප්‍රවේශනය ස්ථිතිය උද්ධාරය ප්‍රවිෂ්ටය යන මෙහිදී; චෙපි, ඉදින් වනාහි; සාදියං, ඉවසන්නේ; චුතො, චුතවූයේයි; හෙවත් පරිජිවූයේයි=

3 අදින්නං මානුසං භණ්ඩං ථෙය්‍යායෙකෙන ආදියං
පඤ්චවීසාව හාරෙසු ගරුකඤ්චෙ චුතො භවෙ–

3 අදින්නං,කයින් වචයින් නුදුන්නාවූ;මානුසං, මනුෂ්‍ය සන්තකවූ; ගරුකං, ගරුවූ; හෙවත් මසු පසක් හෝ ඉන් වැඩියක් අගනාවූ; භණ්ඩං, වස්තුවක්; ථෙය්‍යාය, සොරසිතින්; පඤ්චවීසාව හාරෙසු; පස්විසි අවහාරයන් අතුරෙන්; එකෙන, එක්අවහාරයකින්; ආදියංචෙ, (යම් භික්ෂුවක්තෙම) ගන්නේවීනම්; චුතො භවෙ, (හේතෙම ශාසනයෙන්, චුතවූයේ (වෙ) යි–

4 මනුස්සපාණං පාණොයි ජානංවධකචෙතසා
ජීවිතායො වියොජෙති සාසනාසො පරාජිකො–

4 යො, යම් භික්ෂුවක්තෙමේ; පාණොඉති, ප්‍රාණයෙකැයි; ජානං, දන්නේ; වධකචෙතසා වධකචිත්තයෙන් ද හෝ නොහොත් මරණ අදහස් ඇතිව; මනුස්සපානං, (කලලරූපය පටන් ජීවත් වන) මනුෂ්‍ය ශරීරයක්; ජීවිතා, ජීවිතෙන්ද්‍රියෙන්; වියොජෙති, වෙන්කෙරේද; සො, ඒ (මහණ) තෙම; ශාසනා, ප්‍රතිපත්ති ශාසනයෙන්; පරාජිකො, පරාජය වූයේවෙයි; මෙහි මනුස්සපාණං යී දක්වනලද බැවින් මනුෂ්‍ය නොවන ප්‍රාණයක් මැරීමෙන් පරාජිකාපත්ති නොවනබව ප්‍රකාශිතයි —

5 ඣානාදි භෙදං හදයෙ අසන්තං අඤ්ඤපදෙසඤ්චවිනාධිමානං
මනුස්සජාතිස්සවදෙය්‍ය භික්ඛු ඤාතක්ඛණෙ තෙනපරාජිකොති

**පරාජිකා නිද්දෙසො.**

5 භික්ඛු,(යම්) භික්ෂුවක් තෙම; අඤ්ඤපදෙසඤ්ච, අනිකෙක්හුගේ කීමද; අධිමානඤ්ච, අධිගතයයි උපන්මානයද; විනා, හැර; හදයෙ, (තමාගේ) සිත්හි; අසන්තං, නැත්තාවූ, ඣානාදි භෙදං, ධ්‍යානය ආදි ප්‍රභෙද ඇති උත්තරි මනුෂ්‍යධර්මය; මනුස්සජාතිස්ස, මිනිස්ජාති ඇත්තෙක්හට; වදෙය්‍ය, කියානම්; තෙන, ඒ මිනිස් ජාති ඇත්තහු විසින්;ඤාතක්ඛණෙ, දත්කෙණෙහි හෙවත් සිත්හි අදහාගත් ක්ෂණයෙහි ද හෝ නොහොත්; ඤාතක්ඛණේ, අවබොධකළ ඇසිල්ලෙහි, තෙන, ඒ ශාසනයෙන්; පරාජිකොති, (ඒ මහණතෙම, පැරදුනේමවෙයි —

පරාජිකා නිද්දෙසො, පරාජිකා නිර්දේශය (නිමියේයි–)

(ඉක්බිති සඞ්ඝාදිසෙස ආපත්තීන් දක්වනු පිණිස 'මොචෙතුකාමචිත්තෙන' යනාදිය කියයි–)

6 මොචෙතු කාම චිත්තෙන උපක්කම්ම විමොචයං
සුක්කමඤ්ඤත්‍ර සුපිනා සමණො ගරුකම්ඵුසෙ–

6 මොචෙතු කාමචිත්තෙන,මුදවනු කැමති සිතින්; උපක්කම්ම, උපක්‍රමකොට; සුක්කං, ශුක්ලය; විමොචය, මුදවන්නාවූ; සමණො, ශ්‍රමණතෙම; සුපිනා, ස්වප්නයෙහිවන ශුක්ලමොචනය; අඤ්ඤත්‍ර, හැර; ගරුකං, (සඞ්ඝයාගේ ගරුකභාවයෙන් ගරුකනම්වූ) සඞ්ඝාදිශෙසාපත්තිය, ඵුසෙ, ස්පර්ශකෙරෙයි නොහොත් පැමිණෙයි.

7 කායසංසග්ග රාගෙන මනුස්සිත්ථිං පරාමසං
ඉත්ථිසඤ්ඤී උපක්කම්ම සමණො ගරුකම්ඵුසෙ–

7 සමණො, ශ්‍රමණතෙම; ඉත්ථිසඤ්ඤී, මනුෂ්‍යස්ත්‍රියයි සංඥා ඇත්තේ; කායසංසග්ග රාගෙන, කාය සංසර්ගරාගයෙන්; හෙවත් හස්තග්‍රහණාදි කාය ස්පර්ශරාගයෙන්; උපක්කමම, උපක්‍රමකොට; මනුස්සිත්ථිං, මිනිස්මාගම; පරාමසං, පරාමර්ශනය කරන්නේ; ගරුකම්මූසෙ, ගරුකාපත්තිය ස්පර්ශකෙරේ හෙවත් සඞ්ඝාදිසෙසාපත්තියට පැමිණේ.

8 දුට්ඨුල්ල වාචස්සා දෙන මග්ගං වාරබ්භ මෙථුනං
ඔභාසන්තො මනුස්සිත්ථිං සුණමානං ගරුම්ඵුසෙ-

8 දුට්ඨුල්ල වාචස්සාදෙන, මෛථුන ධර්ම ප්‍රතිසංයුක්ත වාක් ආස්වාද (රාග)යෙන්; මග්ගං වා, (වර්චස්මාර්ග යෝනිමාර්ගයන් අතුරෙන් එක්තරා) මාර්ගයක්හෝ; මෙථුනංවා, මෛථුන (ධර්ම)ය හෝ; ආරබ්භ, අරභයා හෙවත් උදෙසා; සුණමානං, අසන්නාවූ. මනුස්සිත්ථිං, මිනිස්මාගමකට; ඔභාසන්තො, (යම්ශ්‍රමණයක්තෙම) අසද්ධර්ම වචන ප්‍රකාශකරන්නේ; ගරුම්ඵුසෙ, ගරුකාපත්තිය ස්පර්ශකෙරේ-

9 වණ්ණං වත්වාත්තනො කාම පරිචාරියාය මෙථුනං
ඉත්ථිං මෙථුන රාගෙන යාචමානො ගරුම්ඵුසෙ—

9 අත්තනො, තමහට; කාමපාරිචරියාය, කාමයෙන් මෙහෙ කිරීමෙහි; වණ්ණංවත්වා, ගුණකියා; මෛථුන රාගෙන, මෛථුන රාගයෙන්; ඉත්ථිං, මාගමක අතින්; මෙථුනං, මෛථුනය; යාචමානො, යාච්ඤාකරන්නේ; ගරුම්ඵුසෙ, ගරුකාපත්තිය ස්පර්ශකෙරේ—

10 සන්දෙසං පටිග්ගණ්හිත්වා පුරිසස්සිත්ථියා පිවා
වීමංසිත්වා හරං පච්ඡා සමණො ගරුකම්ඵුසෙ=

10 පුරිසස්සවා, පුරුෂයාගේ හෝ; ඉත්ථියාපි, මාගමකගේ හෝ; සන්දෙසං, (කොළස් පිළිබඳකොට කියනලද) හස්නක්; පටිග්ගණ්හිත්වා, පිළිගෙණ; වීමංසිත්වා, (යමෙක් සඳහා යවනලද්ද ඔහු වෙතගොස් අදහස්) පරීක්ෂාකොට; පච්ඡාහරං, ඔහුගේ සන්දෙශ වචනය) පසුව ගෙණයන්නාවූ; සමණො, ශ්‍රමණතෙම; ගරුකම්ඵුසෙ, ගරුකාපත්තිය ස්පර්ශකෙරේ-

11 චාවෙතුකාමො චොදෙන්තො අමූලන්තිම වත්ථුනා
චොදාපයං වා සමණො සුණමානං ගරුම්ඵුසෙ-

11 චාවෙතුකාමො,(බ්‍රහ්මචර්‍ය්‍යායෙන්) චුතකරවනු කැමතිවූ; සමණො, ශ්‍රමණයෙක් තෙමේ; අමූලන්තිම වත්ථුනා,(දර්ශන ශ්‍රවණ පරිසඞ්කිත සඞ්ඛ්‍යාත මුල්නැති හෙයින්) අමූලකවූ පාරාජිකා සඞ්ඛ්‍යාත වස්තුවකින්; සුණමානං, අසමින් සිටි භික්ෂුවකට; චො

දෙනෙනා වා, (තෙමේ) චොදනාකරන්නේ හෝ චොදාපයං වා, (අනුන්ලවා) චොදනාකරවන්නේ හෝ; ගරුම්පුසෙ, ගරුකාපත්තිය සපශීකෙරේ-

12 ලෙසමත්තමුපාදය අමූලන්තිම වත්ථුනා
චාවෙතුකාමො චොදෙනෙනා සුණමානං ගරුම්පුසෙ-

**ගරුකාපත්ති නිද්දෙසො.**

12 ලෙසමත්තං, (ජාත්‍යාදි දසවිධලෙසයන්ගෙන් එක්තරා) ලෙසමාත්‍රයක්; උපාදය, රැගෙණ නොගොත් නිසා; චාවෙතුකාමො, බ්‍රහ්මචය්‍ර්‍යයෙන් චුතකරවනු කැමැත්තේ; අමූලන්තිම වත්ථුනා, අමූලක අන්තිම වස්තුවකින්; සුණමානං, අසමින් සිටි භික්ෂුවකට; චොදෙනෙනා, චෝදනාකරන්නේ; අනන්තර ගාථායෙන් චොදාපයං වා යනු අනුවෘත්තිත බැවින් වා, නොහොත්; චොදාපයං, (අනුන්ලවා) චොදනාකරවන්නේ; ගරුම්පුසෙ, ගරුකාපත්තිය සපශීකෙරේ-

ගරුකාපත්තිනිද්දෙසො,ගරුකාපත්තින්ගේ නිර්දේශය(නිමියේ)යි-

13 විකප්පන මධිට්ඨාන මකත්වා කාලචීවරං
දසාහමති මාපෙති තස්ස නිස්සග්ගියං සියා—

13 අකාලචීවරං, අකල් සිවුරක්; විකප්පනං, විකප්පනයද; අධිට්ඨානං, ඉටිමද; අකත්වා, නොකොට; දසාහං, දසදවසක්; අතිමාපෙති, (යම් භික්ෂුවක්තෙම) ඉක්මවා නම්; තස්ස, ඒ භික්ෂුවට; නිස්සග්ගියං, නිසගි(පචිති) සියා, වෙයි.වන්නේයි-

14 භික්ඛුසම්මුතියා අඤ්ඤත්‍ර තිචීවර මධිට්ඨිතං
එකාහමති මාපෙති නිස්සග්ගි සමයං විනා-

14 භික්ඛුසම්මුතියා අඤ්ඤත්‍ර, භික්ෂු සම්මුතියක් නැතිව; සමයං විනා, චීවරකාලය හැර, අධිට්ඨිතං (චීවරනාමයෙන්) ඉටනලද; චීවරං, තුන්සිවුරෙන්; එකාහං,එකදවසක්; අතිමාපෙති,(යමෙක්) ඉක්මපවත්වානම; නිස්සග්ගි (ඔහට නිසගි (පචිති) වෙයි-

15 අඤ්ඤාතිකා භික්ඛුනියා පුරාණ චීවරමප්පන
ධොවාපෙති රජාපෙති ආකොටාපෙති තං සිය-

15 අඤ්ඤාතිකා භික්ඛුනියා, නෑනෑ මෙහෙණින්නක් ලවා; පුරාණ චීවරමප්පන, (මදකුදු වැලඳගැන්ම හෙතුකොටගෙණ පරණවූ සිවුරක් වනාහී; ධොවාපෙති වා, (යම් භික්ෂුවක් තෙම) සෝදවානම් හෝ; රජාපෙති වා, රඳන් කරවා නම් හෝ හෙවත් පඬුපෙවීම් කරවානම් හෝ; ආකොටාපෙති වා,(සිලාමය දරුමය පෝරු ආදියක ගස්සවානම් හෝ; තං සියා (ඒ භික්ෂුවට) ඒ පළමු නිසගියයි දක්වනලද ආපත්තිවෙයි—

16 අඤ්ඤාතිකා භික්ඛුනියා හත්ථතො කිංචිමූලකං
අදත්වා චීවරාදානෙ නිස්සග්ගිය මුදීරිතං—

16 කිංචිමූලකං, මාරුකීරිම්වශයෙන් දියයුතු යම් කිසිවක්; අදත්වා, නොදී; අඤ්ඤාතිකා භික්ඛුනියා, නොනෑ මෙහෙණියක ගේ; හත්ථතො, අතින්; චීවරදානෙ, සිවුරුගැන්මෙහි; නිස්සග්ගියං නිසගී(පචිති) උදීරිතං, කියතිලදී-

17 අප්පවාරිත මඤ්ඤාතිං විඤ්ඤාපෙන්තස්ස චීවරං
අඤ්ඤත්‍ර සමයා තස්ස නිස්සග්ගිය මුදීරිතං–

17 අප්පවාරිත මඤ්ඤාතිං, නොපැවරූ නොනෑ ගිහියෙක් අතින්; චීවරං, සිවුරක්; සමයා අඤ්ඤත්‍ර, නිසිවූ කාලය හැර; විඤ්ඤාපෙන්තස්ස, ඉල්වන්නාවූ; තස්ස, ඔහට; නිස්සග්ගියං, නිසගී(පචිති) උදීරිතං, කියනලදී-

18 රජතං ජාතරූපං වා මාසකං වා කහාපණං
ගණ්හෙය්‍ය වා ගණ්හාපෙය්‍ය නිස්සග්ගි සාදියෙය්‍ය වා–

18 රජතං වා, රිදීහෝ; ජාතරූපං වා, රත්රන් හෝ; මාසකං වා, මසුහෝ; කහාපණං වා, කහවණු හෝ; ගණ්හෙය්‍යවා, (තෙමේ) ගණීනම්හෝ; සාදියෙය්‍යවා,(කයින් වචසින් ප්‍රතික්‍ෂෙප නොකොට සිතින්) ඉවසානම් හෝ; නිස්සග්ගි, (ඔහට) නිසගී (ඇවැත්වෙ)සි=

19 පරිවත්තෙය්‍ය නිස්සග්ගි රජතාදි චතුබ්බිධං
කප්පියං කප්පියෙනාපි ථපෙත්වා සහධම්මිකෙ–

19 රජතාදි චතුබ්බිධං, රජතාදී චතුර්විධය; (එනම් රිදී රත් රන් මසු කහවණු යන සතරවැදෑරුම්දෙය) පරිවත්තෙය්‍ය, (අනිකකින් පෙරළීම කෙරේනම් හෙවත් මාරුකෙරේනම්; නිස්සග්ගි, (ඔහට) නිසගිවෙසි; සහධම්මිකෙ, පස්සහ දැමියන්; ථපෙත්වා, තබා; කප්පියං, කැප වස්තුවක්; කප්පියෙනාපි, කැපවස්තුවකින්ද; (පරිවත්තෙය්‍ය යනුද නිස්සග්ගි යනුද යළින් වැටේ) පරිවත්තෙය්‍ය, පෙරලානම්; නිස්සග්ගි, (ඔහටද) නිසගිවෙසි-

20 විකප්පන මධිට්ඨාන මකත්වාන පමාණිකං
දසාහමති මාපෙති පත්තං නිස්සග්ගියං සියා–

20 විකප්පනං, (ඉමං පත්තං තුය්හං විකප්පෙමි යනාදීයෙන්) විකප්පනයද; අධිට්ඨානං, (ඉමං පත්තං අධිට්ඨාමි යනාදීයෙන් ඉටීමද, අකත්වාන, නොකොට; පමාණිකං, ප්‍රමාණයෙන් යුක්තවූ; පත්තං පාත්‍රයක් නොහොත් පාත්‍රයෙන්; දසාහං, දස දවසක්; අතිමාපෙති, ඉක්මවානම්; නිස්සග්ගියං සියා, (ඔහට) නිසගී ඇවැත්වෙසි–

21 පඤ්චබන්ධනතො ඌනෙ පත්තෙ සති පරම්පන
විඤ්ඤාපෙති නවම්පත්තං තස්ස නිස්සග්ගියං සියා—

21 පඤ්චබන්ධනතො, පස්බැඳුමකින් හෙවත් පිළියම් පසකින්; ඌනෙ පත්තෙ සති, අඩුපාත්‍රය ඇතිකල්හි; පරං, අනික්; නවං පත්තං පන, අලුත්පාත්‍රයක් වනාහී; විඤ්ඤාපෙති, නොනෑ නොපැවරුවන් අතින්) ඉල්වාගණීනම්; තස්ස, ඔහට; නිස්සග්ගියං සියා, නිසගි (ඇවැත්) වෙයි=

22 පටිග්ගහෙත්වා භුඤ්ජෙය්‍ය සප්පි තෙලාදිකම්පන
සත්තාහමතිමාපෙති තස්ස නිස්සග්ගියං සියා–

22 සප්පිතෙලාදිකංපන, ගිතෙල් තලතෙල් ආදියවනාහී; (ආදිශබ්දයෙන් වෙඬරු මීපැනී උක්සකුරු) පටිග්ගහෙත්වා, පිළිගෙණ; භුඤ්ජෙය්‍ය, වළඳන්නේ; සත්තාහං, සතියක්; අතිමාපෙති, ඉක්මවාතම්; තස්ස, ඔහට; නිස්සග්ගියං සියා, නිසගීවෙයි–

23 භික්ඛුස්ස චීවරං දත්වා අච්ඡින්දන්තස්ස තම්පුන
සකසඤ්ඤාය නිස්සග්ගි අච්ඡින්දාපයතො පිවා–

23 භික්ඛුස්ස, භික්ෂුවකට; චීවරං, සිවුරක්; දත්වා, දී; පුන, නැවත; තං, ඒ සිවුර); සකසඤ්ඤාය, තමන්ගේය යන සංඥායෙන්; අච්ඡින්දන්තස්සවා, පැහැරගන්නාහටද; අච්ඡින්දාපය තොපිවා(අනුන් ලවා) පැහැරගන්වන නැනැත්තාටද; නිස්සග්ගී, නිසගිවෙයි–

24 අප්පවාරිත මඤ්ඤාතිං සුත්තං යාචිය චීවරං
වායාපෙන්තස්ස නිස්සග්ගි විනා ඤාති පවාරිතෙ–

24 අප්පවරිත, නොපැවරූ; අඤ්ඤාති, නොනෑ (ගෘහපති) යෙක් අතින්; සුත්තං, නූල්; යාචිය, ඉල්වාගෙණ; ඤාති පවාරිතෙ විනා; නෑ පැවරූවන් හැර; චීවරං, සිවුරක්; වායාපෙන්තස්ස, වියවන්නාහට; නිස්සග්ගි, නිසගිවෙයි–

25 ජානන්තො භික්ඛුසඞ්ඝස්ස ලාභං පරිණතම්පන
අත්තනො පරිණාමෙති තස්ස නිස්සග්ගියං සියා–

### නිස්සග්ගිය නිද්දෙසො.

25 භික්ඛුසඞ්ඝස්ස, භික්ෂුසඞ්ඝයාට; පරිණතං, පිරිනැමූ; ලාභම්පන, ලාභයක් වනාහි හෙවත් චීවරාදිවස්තුවක් වනාහී; ජානන්තො, දන්නේ; අත්තනො, තමහට; පරිණාමෙති, පිරිනැමූම් කරවාතම්; තස්ස, ඔහට; නිස්සග්ගියං සියා, නිසගිවෙයි–

නිස්සග්ගිය නිද්දෙසො, නිසගි (පචිති) නිර්දේශය (නිමියේ)යි–

(ඉක්බිත්තෙන් පචිති ඇවැත් කියනුලැබේ)

26 සම්පජානමුසාවාදෙ පාචිත්තිය මුදීරිතං
භික්ඛුස්ස ඔමසන්තස්ස පෙසුඤ්ඤෙ හරණෙපිච–

26 සම්පජාන මුසාවාදෙ, දැන දැන බොරුකීම නිමිත්තකොට ගෙණ; පාචිත්තියං, පචිති ඇවැතෙක්යයි; උදීරිතං, කියනලදී; පාචිත්තිය මුදීරිතං යනු ඉතිරි පදවලයහාද සම්බන්ධයි ) භික්ඛුං, භික්ෂුවකට; ඔමසන්තස්සච, සටනාය කරණ භික්ෂුවහටද; (පචිති යයි කියනලදි) පෙසුඤ්ඤෙ හරණෙපිච, කේලාම් වචන ගෙණයා මෙහිද නොහොත් කේලාම් වචන නිමිත්තකොටගෙණද පචිති ඇවැතෙක්යයි කියනලදි–

27 ඨපෙත්වා භික්ඛුනී භික්ඛුං අඤ්ඤෙන පිටකත්තයං
පදසො ධම්මං භණන්තස්ස පාචිත්තිය මුදීරිතං–

27 භික්ඛුනී භික්ඛුං, භික්ෂුණී භික්ෂූයන සමූහය; ඨපෙත්වා, තබා; අඤ්ඤෙන, අන්‍යපුද්ගලයෙක් හා සමග; පිටකත්තයං ධම්මං, පිට කත්‍රය ධර්මය; පදසො, පදවශයෙන්; භණන්තස්ස, කියන භික්ෂුවට පාචිත්තියං,(පදගණනායෙන් ,පචිති ඇවැත්; උදීරිතං,කියනලදී;

28 අනුපසම්පන්නෙන තෙව සයිත්වාන තිරත්තියං
පාචිත්ති සහසෙය්‍යාය චතුත්ථත්ථඞ්ගතෙ පුන–

28 අනුපම්පන්නෙන තෙව, අනුපසම්පන්නයෙක් හා සමගම; තිරත්තියං, තුන්රැයක්; සයිත්වාන, සයනයකොට; චතුත්ථෙ, සතර වන දවස්හි; අත්ථඞ්ගතෙ, හිරුඅස්තඞ්ගතවූකල; පුන, නැවත; සහසෙය්‍යාය, එක්ව සයනය කිරීමෙහි; පාචිත්ති, පචිති (ඇවැතෙක්)වේ පාචිත්ති යනු මත්තටද සම්බන්ධයි–

29 ඉත්ථියා එකරත්තම්පි සෙය්‍යං කප්පයතො පිචා
දෙසෙන්තස්ස විනා විඤ්ඤුං ධම්මඤ්ච ඡ පදුත්තරිං–

29 ඉත්ථියා, (යටත් පිරිසෙයින් එදවස් උපන්නාවූද මිනිස්) මාගමක් හා; එකරත්තම්පි, එකරැයකුදු; සෙය්‍යංකප්පය තොපිචා; (එකසෙනස්නෙහි) සයනය කරණ භික්ෂුවටද; විඤ්ඤුං විනා, නුවණැති (මිනිස්පුරුෂ) යක්හු නැතිව; ඡ පදුත්තරිං, සපදය කින් මත්තෙහි; ධම්මං, ධර්මය; දෙසෙන්තස්සච, (මාගමකට) දෙශනාකරණ භික්ෂුවටද; (පචිති) ඇවැතෙක්වේ–

30 දුට්ඨුල්ලං භික්ඛුනො වජ්ජං භික්ඛු සම්මුතියා විනා
අභික්ඛුනො වදන්තස්ස පාචිත්තිය මුදීරිතං–

30 භික්ඛුනො, භික්ෂුවක්හුගේ; දුට්ඨුල්ලංවජ්ජං, සඞ්ඝාදිසෙ

ඤා පත්තියක්; භික්ඛු සම්මුතියා විනා, භික්ෂුසම්මුතියක් නැතිව; අභික්ඛුනො, අනුපසම්පන්නයෙක් හට; වදන්තස්ස, කියන භික්ෂු වට; පාචිත්තියං, පචිති (ඇවැත්) උදීරිතං, කියනලදී-

31 ඛණෙය්‍ය වා ඛණාපෙය්‍ය පඨවිඤ්චෙ අකප්පියං
භූතගාමං විකොපෙය්‍ය තස්ස පාචිත්තියං සියා-

31 අකප්පියං, අකපවූ; පඨවිඤ්චෙ, පොළොවද; ඛණෙය්‍යවා, (අකපබව දැන දැන තෙමේ) සෑරුයේනම් හෝ; ඛණාපෙය්‍යවා, (අනුන්ලවා) සැරවූයේනම්හෝ; (ඔහට පචිති ඇවැත්වේ) භූතගාමං, (වෘක්ෂලතාදී) භූතසමූහය; විකොපෙය්‍ය, (සිඳීම් බිඳීම් ආදි වශයෙන්) විනාශකෙරේනම්; තස්ස, ඔහට; පාචිත්තියං සියා, පචිති (ඇවැත්) වෙයි; (තස්ස සියා යනු මත්තටද සම්බන්ධයි-)

32 අජ්ඣොකාසෙතු මඤ්චාදිං කත්වා සන්ථරණාදිකං
සඞ්ඝිකං යාති පාචිත්ති අකත්වා පුච්ඡනාදිකං-

32 සඞ්ඝිකං, සඟසතු; මඤ්චාදිං, ඇඳ ආදිය; (ආදිශබ්දයෙන් පුටු බිසි කොච්ඡයයි කියනලද වැහැරි ආදියෙන්තළ තිසීදන) අජ්ඣොකාසෙතු, අභ්‍යවකාශයෙහි වනාහි; සන්ථරණාදිකං, ඇතිරීම් ආදිය; (ආදිශබ්දයෙන් අනුන්ලවා ඇතිරවීම) කත්වා, කොට; ආපුච්ඡනාදිකං, පිළිවිසීම් ආදිය; ආදි ශබ්දයෙන් උඩරණ උඩරාපන) අකත්වා, නොකොට; යාති,(යම් භික්ෂුවක්තෙම) බැහැරට) යේනම්; තස්ස, ඔහට; පාචිත්ති, පචිති ඇවැත්; සියා, වෙයි-

33 සඞ්ඝිකාවසථෙසෙය්‍යං කත්වා සන්ථරණාදිකං
අකත්වා පුච්ඡනාදිං යො යාති පාචිත්ති තස්සපි-

33 යො, යම් භික්ෂුවක්තෙම; සඞ්ඝිකාවසථෙ, සඟසතු ආවාසයෙක්හි, සෙය්‍යං, සයනයක්; සන්ථරණාදිකං, ඇතිරීම් ආදිය; කත්වා, කොට; ආපුච්ඡනාදි, පිළිවිසීම් ආදිය; ආදිශබ්දයෙන් ඔරණ උඩරාපනය)අකත්වා, නොකොට; යාති, (බැහැරට) යේනම්; තස්සපි, ඔහටද; පාචිත්ති, පචිති ඇවැත් වෙයි-

34 ජානං සප්පාණකං තොයං පාචිත්ති පරිභුඤ්ජයෙ
අසඤ්ඤුතිකා භික්ඛුනියා ඨපෙත්වා පාරිවට්ටකං-

34 සප්පාණකං, ප්‍රාණීන් සහිතවූ; තොයං, ජලය; ජානං, දන්නේ; පරිභුඤ්ජයෙ; පරිභොග කෙරේනම්; පාචිත්ති, (ඔහට) පචිත් ඇවැත් වෙයි; පාරිවට්ටකං, පෙරළි හෙවත් මාරුකිරිමක්; ඨපෙත්වා, තබා; අසඤ්ඤුතිකා භික්ඛුනියා, නොනෑ මෙහෙණින්තකට; මත්තට සම්බන්ධයි-

35 චීවරං දෙති පාචිත්ති චීවරං සිබ්බතොපිච
අතිරිත්තං අකාරෙත්වා පවාරෙත්වාන භුඤ්ජතො

35 චීවරං, සිවුරක්; දෙති, දේනම්; පාචිත්ති, (ඒ භික්ෂුහටද,) පචිති (ඇවැත්වෙයි;) චීවරං, (නොනෑමෙහෙණින්කගේ) සිවුරක්; සිබ්බතොපිච, ගෙත්තම්කරණ භික්ෂුවටද; (පචිති ඇවැත්වෙයි,) පවාරෙත්වා, (ලඟටගෙණ භොජනය) ප්‍රතික්ෂෙප කොට, අතිරිත්තං අකාරෙත්වා, අතිරිත්ත නොකරවා; හෙවත් ඉතිරි නොකරවා; භුඤ්ජතො, අනුභව කරන්නාහටද; (පචිති ඇවැත්වෙයි)-

36 භික්ඛුං ආසාදනාපෙක්ඛො පවාරෙති පවාරිතං
නතිරිත්තෙන භුත්තෙතු පාචිත්තිය මුදීරිතං

36 අසාදනාපෙක්ඛො, චොදනා කරණු කැමැත්තේ; පවාරිතං, පවාරණයකළාවූ; භික්ඛුං, භික්ෂුවකට; නතිරිත්තෙන, අනධිකභොජනයකින්; පවාරෙති, පවාරානම්, භුත්තෙතු, (බොජුන්) අනුභව කළකල්හි වනාහි; තස්ස, (අනතිරිත්තභොජනයෙන් පැවරීමකළ) ඒ භික්ෂුවට; පාචිත්තියං, පචිති (ඇවැත්) උදරිතං, කියනලදී.

37 සන්නිධිභොජනං භුඤ්ජෙ විකාලෙයාව කාලිකං
භුඤ්ජතොවාපි පාචිත්ති අගිලානො පණීතකං

37 සන්නිධිභොජනං, සන්නිධිභොජනයක්; භුඤ්ජෙ, අනුභව කෙරේනම්; පාචිත්ති, (පචිති ඇවැත්වෙයි); විකාලෙ, පෙරවරු ඉකුත්කල්හි; යාවකාලිකං, (වනමුල් එලාදි) ආමිස භොජනයක්; භුඤ්ජතොවාපි, අනුභවකරන්නාහට; (පචිති ඇවැත්වෙයි) අගිලානො, නොගිලන්වූයේ; පණීතකං, ප්‍රණීතවූ-මත්තට සම්බන්ධයි-

38 විඤ්ඤාපෙත්වාන භුඤ්ජෙය්‍ය සප්පිතෙලාදි කම්පිච
අප්පටිග්ගහිතං භුඤ්ජෙ දන්තකාඨොදකං විනා

38 සප්පිහත්තාදිකම්පිච, ගිතෙල්මුසු බත් ආදියද; විඤ්ඤාපෙත්වාන, ඉල්වාගෙණ; භුඤ්ජෙය්‍ය, අනුභව කෙරේනම්; (ඔහට පචිති ඇවැත්වෙයි-)

39 තිත්ථියස්ස දදෙකිංචි භුඤ්ජිතබ්බං සහත්ථතො
නිසජ්ජංවා රහො කප්පෙ මාතුගාමෙන චෙකතො

39 තීත්ථියස්ස තීර්ථකයෙක්හට; සහත්ථතො, තමා අතින්; කිංචිභුඤ්ජිතබ්බං, කිසිඅනුභව කළයුක්තක්; දදෙ, දේනම්;(ඔහට

පචිති ඇවැත්වේ)මාතුගාමෙනච, මාගමක්හාද; එකතො, එක්ව; රහො, ප්‍රතිච්ඡන්නයෙහි; නිසජ්ජංවාකප්පෙ, හිඳීම හෝ කෙරේ නම්; (ඔහට පචිති ඇවැත්වෙයි—)

40 සුරාමෙරය පානෙපි, පාචිත්තිය මුදීරිතං
අඞ්ගුලි පතොදකෙ චාපි හසධම්මෙ පිචොදකෙ

41 සුරාමෙරයපානෙපි, සුරාහාමෙරය පානය නිමිත්තකොට ගෙණද; අඞ්ගුලිපතොදකෙචාපි, ඇඟිල්ලෙන් කිසිලි ආදිය සට්ට නය කිරීමයයි කියනලද) ගිරිතිකැවීමෙහිද; නොහොත් ගිරිති කැවීම නිමිත්තකොටගෙණද; පාචිත්තියං, පචිති; (ඇවැත්) උදී රිතං කියනලදී.

41 අනාදරෙපි පාචිත්ති භික්ඛුංභිංසය තොපිවා
භයානකං කථං කත්වා දස්සෙත්වාවා භයානකං

41 අනාදරෙපි,(සිකෂාපදයෙන් අවවාදකළ පුද්ගලයාට හෝ ධර්‍මයට හෝ) අනාදරකිරීමෙහිද; පාචිත්ති, (පචිති ඇවැත්වෙයි;) භයානකං, භයානකවූ රූපයක්; දස්සෙත්වාවා, දක්වා හෝ; භික්ඛුං, භික්ෂුවක්හු; භිංසයතොපිවා, බියගන්වන්නාහටද, (පචිති ඇවැත්වෙයි)

42 ඨපෙත්වා පච්චයං කිඤ්චිඅගිලානො ජලෙය්‍ය වා
ජොතිං ජලාපයෙය්‍ය වා තස්ස පාචිත්තියං සියා,

42 අගිලානො, නොගිලන්වූයේ; කිඤ්චිපච්චයං, (පහන් දැල් වීම පාත්‍ර පිළිසීම් ආදී) කිසි ප්‍රත්‍යයක්; ඨපෙත්වා, තබා; ජොතිං, ගිනි; ජලෙය්‍යවා, (තෙමේ) දල්වන්නේනම්හෝ; ජලාපයෙය්‍යවා, (අනුන් ලවා)දල්වන්නේනම් හෝ; තස්ස, ඔහට; පාචිත්තියංසියා, පචිති (ඇවැත්) වෙයි.–

43 කප්පබින්දුමනාදය නවචීවර භොගිනො
හසා පෙකඛස්සපාචිත්ති භික්ඛුනො චීවරාදිකං

43 කප්පබින්දු,(මොණර ඇස්මඬල මකුණුපිට යන මොවුන් අතුරෙන් අන්‍යතරයක් ප්‍රමාණවූ) කප්බිඳුව; අනාදය, නොගෙණ; නවචීවර භොගිනො, අලුත් සිවුරක් පරිභොගකරණ භික්ෂුවට, පාචිත්ති (ඇවැත්වෙයි;) භික්ඛුනො, භික්ෂුවක්හුගේ; චීවරාදිකං සිවුරු ආදි පරිෂ්කාරයක් ආදි ශබ්දයෙන් සැම ශ්‍රමණ පරිෂ්කාර) මත්තකට සම්බන්ධයි.

44 අපනෙත්වා නිධෙන්තස්ස නිධාපෙන්තස්සවාපන
ජානංපාණං හනෙන්තභික්ඛු තිරච්ඡාන ගතම්පිච

44 අපනෙත්වා, පහකොටගෙණ; නිධෙන්තස්ස (තෙමේ)සඟ වන්නාවූද; නිධාපෙන්තස්සවාපන, අනුන්ලවා සඟවවන්නාවූද;

හසාපෙකඛස්ස, (යථෙංකතක්‍රියාවෙන්) ක්‍රීඩාකැමැතිවූ භික්ෂුවට; (පචිති ඇවැතිවෙයි) ජානං, (ප්‍රාණයකැයි) දන්නේ; තිරච්ඡාන ගතම්පිච, තිරශ්චීනගතවූද; ප්‍රාණං, ප්‍රාණයක්; හනෙ, නසානම්, (ඔහට පචිති ඇවැත්වෙයි)

45 ජාදෙතුකාමො ජාදෙති දුට්ඨුල්ලං භිකඛුනොපිච
ගාමනතර ගතස්සාපි සංවිධායිත්‍ථියා සහ

45 භිකඛුනො, භික්ෂුවක්හුගේ; දුට්ඨුල්ලමපිච, සඞඝාදිසෙසාපත්තියකුදු; ජාදෙතුකාමො, වසනුකැමතිවූයේ; ජාදෙති. යම් භික්ෂුවක්තෙම) සඟවානම්, (ඔහට පචිති ඇවැත්වෙයි) සංවිධාය, මතග්‍රනයකොට; ඉත්‍ථියා සහ, (ස්ත්‍රීස්) මිගමක් හා එක්ව, ගමන්තරගතස්සාපි, හුන්ගමින් අන්ගමකට ගිය භික්ෂුවටද; (පචිති ඇවැත්වෙයි)

46 භිකඛුං පහරතෙංවාපි තලසත්තික මුගගිරෙ
වොදෙතිවා වොදාපෙති ගරුනා මූලකෙනපි

46 භිකඛුං, භික්ෂුවක්හට; පගරතොවාපි, ප්‍රහාරණය කරන්නාහටට; (පචිතිඇවැත්වේ) භිකඛුං, භික්ෂුවක්හට; තලසත්තිකං, අත්සත්; උගගිරෙ, නගානම්; (පචිතියි) අමූලකෙන, දෘෂ්ටශාතාදී) මූල්නැත්තාවූ; ගරුනාපි, සඞඝාදිසෙසාපත්තියකින්ද, වොදෙතිවා, (භික්ෂුවක්හටතෙමේ) චොදනා කෙරේනම් හෝ; වොදාපෙතිවා, (අනුන්ලවා) චොදනා කරවානම් හෝ; (ඔහට පචිති ඇවැත්වෙයි–)

47 කුකකුච්චුප්පාදතෙවාපි හණ්ඩනත්‍ථායු පස්සුතිං
සොතුංහණ්ඩන ජාතානං යාතිපාචිත්තියංසියා.

47 කුකකුච්චුප්පාදනොවාපි, (අනුපසමපන්නොත්‍ථං මඤ්සැදෑයනාදීවචනයෙන්) කුකුසක් ඉපදවීමෙහිද; (පචිති ඇවැත්වෙයි) හණ්ඩනත්‍ථාය, කලහපිණිස; පිණ්ඩනජාතානං, උපන්ඩබර ඇත්තවුන්ගේ; සොතුං, (වචන) අසන්නට; උපස්සුතිං, බස්ඇසෙනතැනම; යාති, යේනම්; පාචිත්තියං සියා, (ඔහට) පචිති ඇවැත්වෙයි–

48 සඞඝස්සලාභං පරිනාමිතනතු
නාමෙතියොතං පරපුගගලස්ස
පුච්ඡං අකත්‍වාපිච සනත භිකඛුං
පාචිත්ති ගාමස්සගතො විකාලෙ.

**පාචිත්තිය නිද්දෙසො.**

——::——

48 යො, යම්භික්ෂුවක් තෙම; සඞ්ඝස්ස, සඞ්ඝයාට; පරිනාමිතං, පිරිනමනලද; යංලාභං, යම් (චීවරාදි) ලාභයක් ඇද්ද; තං තු, ඒ ලාභයවනාහි; පරපුග්ගලස්ස, අන්‍යපුද්ගලයෙකුට; නාමෙති, පිරිනැමුම්කරවා නම්;(ඔහට පචිත්ති වේ) සන්තභික්ඛුං, විද්‍යමානභික්ෂුව; පුච්ඡං අකත්වා, විචාරීම් නොකොට; විකාලෙ, විකාලයෙහි; ගාමස්ස, ගමට; ගතෙඅපිච, ගියභික්ෂුවටද; පාචිත්ති, පචිත්ති ඇවැත්වේ—

පාචිත්තිය නිද්දෙසො, පචිත්තිනිර්දේශය (නිමියේ)යි=

(දූත් ප්‍රකීර්ණකය දක්වනු පිණිස 'සඞ්ඝිකං' යනාදිය ආරබ්ධයි)

— × —

49 සඞ්ඝිකං ගරුකං භණ්ඩං යො දෙත්‍යඤ්ඤස්ස ඉස්සරො
ථුල්ලච්චයං යථා වත්‍ථු ථෙය්‍යා පාරාජිකාදිපි.

49 යො, යම්භික්ෂුවක් තෙම; ඉස්සරො, ඉසසරවූයේ, සඞ්ඝිකං, සඞ්ඝසන්තකවූ; ගරුකං භණ්ඩං, ගරුබඩු; අඤ්ඤස්ස, අනිකෙකුට; දෙති, දේනම්; ථුල්ලච්චයං, (ඔහට) තුලසි(නම් ඇවැතෙක්වේ) ථෙය්‍යා, සොරසිතින්; (අනිකෙකුටදේනම්) යථා වත්‍ථු, වස්තුවූ පරිද්දෙන් හෙවත් බඩු අගනා සෙයින්, පාරාජිකාදිපි, පරිජි ආදිදවෙ—

50 කුසාදිමය චීරානි කම්බලං කෙසවාලජං
සමයං විනා ධාරයතො ලූකපක්ඛා ජිනක්ඛිපං

50 කුසාදිමය චීරානි කුසතෘණාදියෙන් කළ වැහැරිදු;(ආදි ශබ්දයෙන් වාක හෙවත් වක්කල, ඵලක හෙවත් පුවරු චීවර යනාදු)කෙසවාලජං, කෙසයෙන් හා වාලයෙන් කළාවූ; කම්බලං, පලසුදු; උලූකපක්ඛං, මහඹුහුණු පියාපත්හා; අජිනක්ඛිපං, අඳුන්දිවි සම්දු; සමයං විනා, (කස්වචීවර) කාලය තබා ධාරයතො, දරන්නාහට; යටින් ථුල්ලච්චයං යනු වැටෙන හෙයින්) ථුල්ලච්චයං, තුලසිවේ—

51 සත්‍ථකම්මෙ වත්‍ථිකම්මෙ සනිම්භාතඤ්ච ඡින්දතො
ථුල්ලච්චයං මනුස්සානං මංසාදි භොජනෙපිවා

51 සත්‍ථකම්මෙ, ශස්ත්‍රයෙන් (නැළිම් ආදි)කළයුතු කර්මයෙහිද; වත්‍ථිකම්මෙ, වස්තියෙහි (කළයුතු) කර්මයෙහිද; 'තුලසියි' සනිම්භාතං, නම්බ නිමියි; ඡින්දතොව සිඳින්නාහටද; තුලසියි, මනුස්සානං, මිනිසුන්ගේ; මංසාදි, මස්ආදිය; (ආදි ශබ්දයෙන් ඇට ලේ සම් ලොම) භොජනෙපිවා, අනුභව කිරීමෙහිද; ථුල්ලච්චයං, ථුලසිවෙයි

52 කදලෙරකක්කත දුස්සානි පොත්‍ථකං සබ්බ නීලකං
සබ්බපීතාදිකඤ්චාපි ධාරයන්තස්ස දුක්කටං

52 කදලි එරක අක්කදුස්සානි, කෙසෙල්, එරුපත්, වාරාදු ලෙන් කළ පිළිද; පොත්ථකං, මකවිද්දලෙන් කළපිළීද සබ්බනීල කං, සව්නිල්පිළීද; සබ්බ පීතාදිකඤ්චාපි, සව්රන්වන් පිලී ආදි යද; (ආදිශබ්දයෙන් සම්ලොහිතක, සම්කෘෂ්ණක, සම්මාඤ්ජෙෂ්ඨික පිළි) ධාරයන්තස්ස, දරන්නාහට; දුක්කටං, දුකුළා වෙයි–

53 හත්ථිස්සුරග සොණානං සීහබ්‍යග්ඝච්ඡ දීපිනං
තරච්ඡස්සච මංසාදිං උද්දිස්ස කතකම්පිච

53 හත්ථි අස්ස උරග සොණානං, හස්තිය අශ්වය දීඝජාතිය සුණඛය යන මොවුන්ගේද; සීහ බ්‍යග්ඝ අච්ඡ දීපීනං, සිංහය ව්‍යාඝ්‍රය වලස්ය දිවිය යන මොවුන්ගේ; තරච්ඡස්සච, කරබානා වලස් හුගේද; මංසාදිං, මංසාදියද (ආදි ශබ්දයෙන් මෙතෙක් දෙනාගේ ඇටද, සමුදු, ලොමුදු,) උද්දිස්ස, භික්ෂූඋදෙසා; කතකම්පිච, මැරූ මාංසද; මත්තට සම්බන්ධයි–

54 අනුපුච්ඡිත මංසඤ්ච භුඤ්ජතො දුක්කටං සියා
යාතානුපුබ්බං හිත්වා නදක තිත්ථාදිකං වජෙ

51 අනාපුච්ඡිත මංසඤ්ච, නොවිචාරණලද මාංසයද; භුඤ්ජතො; වළඳන්නාහට; දුක්කටංසියා, දුකුළාවෙයි; යාතනුපුබ්බං, යතවුන්ගේ අනුක්‍රමය; හිත්වාන, හැර; දකතිත්ථාදිකං, නහන තොට ආදියට; ආදීශබ්දයෙන් වච්චපස්සාව කුටිවලට) වජෙ, යේනම්; (දුකුළාවේ—)

55 සහසාවුබ්භජිත්වාන පවිසෙ නික්ඛමෙය්‍යවා
වච්චපස්සාව කුටිකං විනා උක්කාසිතං විසෙ

55 සහසා, වෙගයෙන්; වුබ්භජිත්වාන, අඳනය දුරදීම නගා; වච්චපස්සාව කුටිකං, වැසිකිලිය හා කෙසකිලියට, පවිසෙවා වදිනම්හෝ; නික්ඛමෙය්‍යවා, (එයින්) නික්මේනම් හෝ (දුකුළායි) උත්කාසිතං, කැරිම; විනා, හැර, විසෙ, (එයට) ප්‍රවිෂ්ටවේනම් (දුකුළාවේ–)

56 නිත්ථුනන්තො කරෙවච්චං දන්තකට්ඨඤ්ච ඛාදයං
වච්චපස්සාව දොණීනං බහිවච්චාදිකං කරෙ

56 නිත්ථුනන්තොව, නහනමින්ද; දන්තකට්ඨං, දැහැටි; ඛාදයඤ්ච, කමින්ද; වච්චංකරෙ, වර්චස්කෙරේනම්; වච්චපස්සාව දොණීනං, මලමූත්‍ර ආවාටයන්ගේ; බහි, පිටය; වච්චාදිකං, මලමූත්‍ර; කරෙ, කෙරෙ, කෙවර්නම්; (දුකුළාවේ–)

57 ඛරෙනවා වලෙඛෙය්‍ය කළම්පාතෙය්‍ය කූපකෙ
උහතඤ්ච නධොවෙය්‍ය උක්ලාපඤ්ච නසොධයෙ

57 ඛරෙනච, කොරොස් පුසකින්; අවලෙඛෙය්‍ය, පුසන්කිස කෙරේනම්; කූපකෙ, වැසිකිළිවලෙහි; නඑමපාතෙය්‍ය, පුසන්ලා නම්; ඌහතඤ්ච, තැරවුණුමලද; නධොවෙය්‍ය, නොහරීනම්; උක්ලා පඤ්ච, කසලද; නසොධයෙ, නොහැමදීනම්; (දුකුළාවේ)

58 දකකිච්චං කරොන්තස්ස කත්වාචපුච පූතිච
අනජ්ඣිට්ඨොච ථෙරෙන පාතිමොක්ඛම්පි උද්දිසෙ=

58 චපුචපූඉති, චපුචපු යනුත අනුකරණහඬ; කත්වා, කොට; දක කිච්චංකරොන්තස්සච,ජලකෘත්‍යය කරන්නාහටද;(දුකුළාවේ) ථෙරෙන, සඞ්ඝස්සසථවිරහු විසින්; අනජ්ඣිට්ඨොඑච, නො ඇණ වන ලද්දේම; පාතිමොක්ඛම්පි, ප්‍රාතිමොක්ෂයද; උද්දිසෙ, උදෙසා නම්; (දුකුළාවේ)

59 අනාපුච්ඡාය පඤ්හස්ස කථනෙ විස්සජ්ජනෙපිච
සජ්ඣාකරණෙදීප ජාලනෙ විජ්ඣාපනෙපිච—

59 අනාපුච්ඡාය,(මහල්ලන් ) නොපිළිවිස; පඤ්හස්සකථනෙ, පැණපිළිවිසිමෙහිද; විස්සජ්ජනෙපිච, විරදීමෙහිද; සජ්ඣායකරණෙ, හදෑරුම්කිරීමෙහිද; දීපජාලනෙ,පහන්දල්වීමෙහිද; විජ්ඣාපනෙපිච, (පහන්) නිවීමෙහිද, (දුකළාවේ)

60 වාතපානක වාටානි විවරෙය්‍ය ථකෙය්‍යවා
වන්දනාදිං කරෙනගෙගා ගමනං භොජනාදිකං

60 අනාපුච්ඡාය,යනු යටින් වැටේ) අනුපුච්ඡාය,(මහල්ලාන් නොපිළිවිස; වාතපානක වාටානි, ආලොකසන්ධි එලකහා වාර එලකයන්; විවරෙය්‍යවා, හරීනම්හෝ; ථකෙය්‍යවා, පියාලානම් හෝ; (දුකුළාවේ) නගෙගා, නග්නවූයේ; වන්දනාදිං, වැඳුම ආදී යද; (ආදිශබ්දයෙන් වැඳුම් ගැණීම) ගමනං, ගමන්ද; භොජනාදිකං, ආහාරවැලඳීම් ආදීයද; (ආදිශබ්දයෙන් පිම, කෑම, ගැන්ම, දීම;) කරෙ, කෙරේනම්; (දුකුළාවේ)

61 පරිකම්මං කරෙකාරෙති පටිච්ඡන්නකං විනා
කායං නහායං සංසෙය්‍ය කුඩ්ඩෙත රුම්හිවා

61 තිපටිච්ඡන්නකංවිනා, (ජන්තාඝර පටිච්ඡාදිය, උදකපටිච්ඡාදිය, වස්ත්‍රපටිච්ඡාදිය, යන) තුන් ප්‍රතිච්ඡන්නය හැර; පරිකම්මං, පිරියම්; කරෙ, (තොමේ)කෙරේනම්; කාරෙ, (අනුන්ලවා) කරවානම්;(දුකුළාවේ නහායං, ස්නානය කරන්නේ; කුඩ්ඩෙවා, භිත්තියෙහි හෝ; ථම්භෙවා, ටැම්හි හෝ; තරුම්හිවා, රුක්හි හෝ; ථම්භො, කායං, ශරීරය; සංසෙය්‍ය, ගගානම්; (දුකුළාවේ).

62 කුරුවින්දක සුත්තෙන අඤ්ඤමඤ්ඤස්සව කායතො
අගිලානොබහාරාමෙ වජෙය්‍යස උපාහනො

62 කුරුවින්දක සුත්තෙන, කුරුඳුවැලෙන්; (කායං, යනුද; සංසෙය්‍ය, යනුද වැටෙන බැවින් කායගහානම්(දුකුළාවේ අඤ්ඤ මඤ්ඤස්සව, අන්‍යොන්‍යයාද; කායතො, ශරීරයෙන්; (ගහාඋලංනම දුකුළාවේ;) අගිලානො, නොගිලන්වූ; සඋපාහනො, වහන්සහිත තැනැත්තේ; බහාරාමෙ, ආරාමයෙන් බැහැර; වජෙය්‍ය, යේනම්; (දුකුළාවේ)

63 උපාහනං යොධාරෙති සබ්බනීලාදි කම්පිච
නිමිත්තයං ඉත්ථියාරත්තො මුඛං වා භික්ඛුදූසියා

63 යො, යම් භික්ෂුවක්තෙම; සබ්බනීලාදිකම්පිච, සම්නිලාදී වූද;(ආදිශබ්දයෙන් සම්ලොහිත ඔදාත, පීත, කෘෂ්ණ, මාඤ්ජෙෂ්ඨ මහාරඞ්ග, මහානාම රඞ්ගරත්තාදීවූද;) උපාහනංධාරෙති, වහන් ලාද; ඕහට දුකුළාවේ) රත්තො, රාගසිත් ඇත්තේ; ඉත්ථියා (එද වස් උපන්නාවූද මිනිස් අමිනිස් තිරිසන්) මාගමකාගේ; නිමිත්තං වා, නිමිත්තහෝ; භික්ඛුදූසියා, භික්ෂුව දෙන්නියගේ; මුඛංවා මුහුණහෝ; මතුසම්බන්ධයි—

64 උජ්ඣානසඤ්ඤී අඤ්ඤස්සපත්තං වා අත්තනොමුඛං
ආදාසාදිම්හි පස්සෙය්‍ය උච්චාසන මහාසනෙ

64 උජ්ඣානසඤ්ඤී, අවමන්සඤ්ඤ ඇතිවූයේ; අඤ්ඤස්ස, අන් භික්ෂුවකගේ; පත්තංවා, (වළඳන) පාත්‍රයහෝ; ආදාසාදිම්හි, කැට පත් ආදියෙහි, (ආදිශබ්දයෙන් පැන්පායාදියයි, නොහොත් යම් යම් තැන මුඛනිමිත්ත පෙණේද ඒ ඒ තන්හි) අත්තනොමුඛංවා, තමාමුහුණ හෝ; පස්සෙය්‍ය, බලානම්; (දුකුළාවේ) උච්චාසන මහාසනෙ, උසසුන් මහඅස්නෙහි; මතුසම්බන්ධයි—

65 නිසජ්ජාදි කරොන්තස්ස දුක්කටං වන්දනෙපිච
උක්ඛිත්තානුපසම්පන්න නානාසංවාස කාදිනං

65 නිසජ්ජාදිං, හිඳීම් ආදිය; කරොන්තස්ස, කරෙණ භික්ෂුව හට; දුක්කටං, දුකුළාවේ) උක්ඛිත්ත, උක්ඛිත්තකයාද; අනුපසම්පන්න, අනුපසම්පන්නයාද; නානාසංවාසක, නානා සංවාසකයාද, යන, ආදීනං, (ආදිශබ්දයෙන්, ඡින්නමූලක හෙවත් අන්තිම වස්තු වල පැමිණියාවද;) වන්දනෙපිච, වැඳීමෙහිද; (දුකුළාවේ—)

66 එකතො පණ්ඩකිත්ථීහි උභතොබ්‍යඤ්ජනෙනවා
දීඝාසනෙ නිසීදෙය්‍ය අදීඝෙ ආසනෙ සහ

66 දීසාසනෙ, දික්අස්නෙහි; පණ්ඩකිත්ථිහිවා, පණ්ඩකය ස්ත්‍රීය යන මොවුන්හාද; උභතො බ්‍යඤ්ජනෙන වා, උභතො බ්‍යඤ්ජනයාහාද; එකතො, එක්ව; නිසීදෙය්‍ය, (යමෙක්) හිඳිනම්; (ඕහට දුකුළාවේ) ආදීසෙ ආසනෙපන, නොදික් අස්නවූ වෘංගි මතුසම්බන්ධයි.=

67 අසමානසිකෙනාපි මඤ්චපීඨෙ සයෙය්‍යවා
කුලසඞ්ගහත්ථං දදතො ඵලපුප්ඵාදි කම්පිච

මඤ්චපීඨෙ, ඇඳපුටුවෙහි; අසමානසිකෙනාපි, අසමානසිකයාහාද; සයෙය්‍යවා, හොවීනම්; (වා ශබ්දය අවුත්ත සමුච්චය හෙයින් හිඳිනම් දුකුළාවේ) ඵලපුප්ඵාදි කම්පිච, ගෙඩිමල් ආදී යද; කුලසඞ්ගහත්ථං, කුලසංග්‍රහය පිණිස; දදතො, දෙනතෑනෑත් නාහට; (දුකුළාවේ)

68 ගන්ථිමාදීං කරෙකාරෙ ජිනවාරිත පච්චයෙ
පරිභුඤ්ජෙය්‍ය අබ්‍යත්තො අනිස්සාය වසෙය්‍යවා,

68 ගමන්ථිමාදිං, ගන්ථිම යනාදි පුෂ්පවිකෘතිය; කරෙ, (තෙමේ) කෙරේනම්; කාරෙ, (අනුන් ලවා) කරවානම්; ජිනවාරිත පච්චයෙ, බුදුන් විසින් වැළැක්වූ ප්‍රත්‍යයන්; පරිභුඤ්ජෙය්‍ය, වළඳනම්; (දුකුළාවේ) අබ්‍යත්තො, නොවියත්වූයේ; අනිස්සාය, ආචාර්‍ය උපාධ්‍යායයන්) නොනිසාදෝහෝ නොහොත් නිසනො, ගෙණ, වසෙය්‍යවා, වෙසේනම් හෝ දුකුළාවේ=।

69 අනුකූදෙතෙහි අකූදස්ස හෙසජ්ජංවා කරෙවදෙද
කාරෙසාපත්තිකො භික්ඛූඋපොසථපවාරණං

69 අනුකූදෙතෙහි, අකුදන්තවුන් කෙරෙන්; අකූදස්ස, අති කෙකුට; හෙසජ්ජං, පිළියම්; කරෙවා. කෙරේනම් හෝ; වදෙවා, කියානම් හෝ;(දුකුළාවේ) සාපත්තිකො, ආපත්තිසහිතවූ; භික්ඛූ, භික්ෂුතෙම; උපොසථ පවාරණං, පොහෝපවුරුණු; කාරෙ, කෙරේනම්; (දුකුළාවේ–)

70 වාරබන්ධාදි හොයානෙ පරිවත්තක වාටකං
අපිධාය විනාභොගං නියොගං වාසගයදිවා

70 ආභොගංවා, (මෙ)පෙමදෙරප්‍රතිජගගණය කරන්නේයයි යන) සැලකීම හෝ; නියෝගංවා, නියෝගය හෝ; විනා. හැර; වාරබන්ධාදිකෙ, වාරබන්ධාදිය ඇති; යානෙ. සෙනස්නෙහි; පරිවත්තකවාටකං, පිරිවැටෙනදෙර; අපිධාය, නොපියා; දිවා, දවල්; සයෙ, සයනය කෙරේනම්; (දුකුළාවේ)

71 ධඤ්ඤිත්ථිරූපරතනං ආවුධිත්ථිපසාධනං
තුරියභණ්ඩංඵලං රුක්ඛ පුබ්බණ්ණාදිඤ්ච ආමසෙ

71 ධඤ්ඤ, සප්තවිධ ධාන්‍යයද; ඉත්ථිරූප, (දැව ලෝහාදිමය වූ) ස්ත්‍රීරූපද; රතනං, (දසවිධ) රත්නද; ආවුධ, (අඩයටි තෝමරාදී සැම) ආයුධද; ඉත්ථිපසාධනං, ස්ත්‍රීපලඳනාද; තුරියභණ්ඩං, තූර්‍ය්‍යබඩුද; රුක්ඛ, වෘක්ෂයෙහි; ඵලං, ගෙඩිද; අපුබ්බණ්ණාදිච, (මුගඟමාසාදී) අපරණ්ණයද; ආමසෙ, පිරිමදීනම්; (දුකුලාවේ-)

72 සසිත්ථොදක තෙලෙහි ඵණහත්ථ ඵණෙහිවා
කෙසමොසණ්ඨනෙකස්මිං භාජනෙ භුඤ්ජනෙපිච

72 සසිත්ථොදකතෙලෙහි, මීඉටිහා දිය සහිත තෙලින් නොහොත් ඉටිමුසු තෙලින්ද; දියමුසු තෙලින්ද; ඵණහත්ථ ඵණෙහිවා, (දත් කම්යාදී) පනාවෙන් හෝ; (පනාකෘත්‍යය සාදන හස්තාඞ්ගුලි සඞ්ඛ්‍යාත) අත් පනාවෙන් හෝ; කෙසං, කෙස්; ඔසණ්ඨනෙ, මටකිරිමෙහිද; ඵකස්මිං භාජනෙ, එක් භාජනයෙක්හි; භුඤ්ජනෙපිච, (අනිකෙකුහා එක්ව) වැළඳීමෙහිද; (දුකුලාවේ-)

73 ඵකත්ථරණ පාපුරණා සයෙය්‍යුං වෙකමඤ්චකෙ
දන්තකට්ඨඤ්ච ඛාදෙය්‍ය අධිකූනං පමාණතො,

73 වෙ, (භික්ෂූහු) දෙදෙනෙක්; ඵකත්ථරණ පාපුරණා, එක් ඇතිරිලි ඇත්තාහුද; එක්පෙරවුම් ඇත්තාහුද; සයෙය්‍යුං, හොවිත්නම්; එකමඤ්චකෙ, එක ඇඳෙහි හොවිත්නම්; පමාණතො, ප්‍රමාණයෙන්; අධිකූනං, වැඩිඅඩුවූ; දන්තකට්ඨඤ්ච, දැහැටිද; ඛාදෙය්‍ය කානම්; (දුක්කටාපත්තිවේ)

74 යොජෙතිවා යොජාපෙති නච්චං ගීතඤ්ච වාදිතං
දස්සනං සවනං තෙසං කරොන්තස්සච දුක්කටං.

74 නච්චඤ්ච, නැටීමද; ගීතඤ්ච, ගායනාවද; වාදිතඤ්ච, වාදනයද; යොජෙතිවා, (තෙමේම හෝ) යොදයිද; යොජාපෙතිවා, (අනුන් ලවා හෝ) යොදවයිද; (ඔහට දුකුලාවේ) තෙසං, ඒ නෘත්‍යගීතවාද්‍යයන්ගේ; දස්සනඤ්ච, බැලීමද; සවනඤ්ච, ඇසීමද; කරොන්තස්ස, කරන්නාහට; දුක්කට, දුකුලාවේ

75 වීහාදිරොපිමෙචාපි බහිපාකාර කුඩ්ඩකෙ
වච්චාදිඡඩ්ඩනාදීච්ඡි දීඝකෙසාදි ධාරණෙ.

75 වීහාදිරොපිමෙචාපි, වී ආදිය රෝපනයකළ තැන්හිද; බහිපාකාරකුඩ්ඩකෙ, පවුරුභිත්තීන් බැහැරද; වච්චාදිඡඩ්ඩනාදීච්ඡි,

මලමූත්‍රාදීන් දැමීම ආදියෙහි; (ආදිශබ්දයෙන් දුම්බීමෙහි දුකුළායි) දීඝකෙසාදි, දික්කෙස් ආදිය; (ආදිශබ්දයෙන් නියනැහැ ලොම්ද) ධාරණෙ, දැරීමෙහි; (දුකුළාවේ)

76 නඛමට්ඨිකාරණාදිම්හි සම්බාධෙ ලොමහාරණෙ
පරිකම්මිකතං භූමිං අක්කමෙස උපාහනො,

76 නඛමට්ඨකරණාදිම්හි, නියමට්ටකෙරීම් ආදියෙහිද; (ආදිශබ්දයෙන් මට්ටම්කරවීම හා රජන් කිරීමෙහිද) සම්බාධෙ, දෙකිළිලි හා මූත්‍රකරණ ස්ථානයෙහි; ලොමහාරණෙ, රෝම ඉදිරීමෙහිද; (දුකුළාවේ) සඋපාහනො, වහන් සහිතවූයේ; පරිකම්මකතං, පිරියම් කළ; භූමිං, බිම; අක්කමෙ, ඇක්මේනම්; (දුකුළාවේ)

77 අධොත අල්ලපාදෙහි සංඝිකං මඤ්චපීඨකං
පරිකම්මකතං භිත්තිං ආමසන්තස්ස දුක්කටං,

77 අධොත අල්ල, නොසෝදන ලද්දාවූද තෙත්වූද; පාදෙහි, පයින්; සංඝිකං, සඟසතු; මඤ්චපීඨකං, හැඳපුටු; අක්කමෙ, ඇක්මේනම්; (දුකුළායි) පරිකම්මකතං, පිරියම්කළ; භිත්තිං, භිත්තිය; ආමසන්තස්ස, අතින් ආමර්ශනය කරන්නාහට; දුක්කටං, දුකුළාවේ;

78 සඞ්ඝාටියාපි පල්ලත්ථෙ දුප්පභුඤ්ජෙය්‍ය චීවරං
අකායබන්ධනො ගාමං වජෙ කත්වා නවච්චකං,

78 සඞ්ඝාටියා, ඉටුසඟලසිවුරෙන්; පල්ලත්ථෙපි, පල්ලත්ථාකිරීමෙහිද; (දුකුළායි) චීවරං, (තුන්සිවුරෙන් එක්තරා) සිවුරක්; දුප්පභුඤ්ජෙය්‍ය, දුප්පරිභොග කෙරේනම්; (දුකුළායි) අකායබන්ධනො, කහබහන් නැත්තේ; ගාමංවජෙ, ගම්වදිනම්; (දුකුළායි) වච්චංකත්වාන, වර්චස් (කෘත්‍යය) කොට;-මතුසම්බන්ධයි.

79 නාචමෙය්‍යුදකොසන්තෙ සමාදෙය්‍ය අකප්පියෙ
දෙසනාරොචනාදිම්හි සභාගාපත්තියාපිච,

79 උදකොසන්තෙ, දියඇතිකල්හි; නආචමෙය්‍ය, ජලකෘත්‍යය නොකෙරේනම්; (දුකුළාවේ) අකප්පියෙ, අකපකම්යෙහි; සමාදෙය්‍ය, (පස්සහඳුවියන්) සමාදන් කරවානම්; හෙවත් යොදවානම් (දුකුළාවේ) සභාගාපත්තියාපිච; සභාගාපත්තියද; දෙශනාරොචනාදිම්හි, දෙසීමහා ආරෝචනය කිරීමාදියෙහිද; (දුකුළාවේ)

80 නචසෙවස්සං විසංවාදෙ වුඩ්ඪිතො පටිස්සවං
වස්සංවසිත්වා ගමනෙ අනාපුච්ඡාව කිච්චතො,

80 වස්සං නවසෙ, වස්නොවසානම්; (දුකුලාවේ) පටිස්සවං, (වසන්නෙමියි යන) ප්‍රතිඥව; විසංවාදෙ, විරුද්ධකරන්නාවූ; සුද්ධ චිත්තා, සුද්ධවූසිත් ඇති භික්‍ෂුහට; (දුකුලාවේ) වස්සංවසිත්වා, වස්වැස; අනනුඤ්ඤාත කිච්චතො, අනුනොදත් කෘත්‍යයකින්; ගමනෙ, යාමෙහිද; (දුකුලාවේ)

81 විනාපදං තරුස්සුද්ධං පොරිසම්හාභිරූහණෙ
අපරිස්සාවනොද්ධානං වජෙතං යාචතානදෙ,

ආපදංවිනා, අන්තරායක්නැතිව; පොරිසම්හා, පුරුෂප්‍රමාණයෙන්; උද්ධං, මත්තෙහි; තරුස්ස, රුකට; අභිරූහණෙ, නැගීමෙහි; (දුකුලාවේ) අපරිස්සාවනො, පෙරහන් නැතිනැත්තේ; අද්ධානං, දීර්ඝමාර්ගයට; වජෙ, යේනම්; (දුකුලාවේ) තං, ඒ පෙරහන; යාචතො, ඉල්වන්නාහට; නදෙ, (යමෙක්) නොදේනම්; (ඔහට දුකුලාවේ)

82 අත්තනො ඝාතනෙ ඉත්ථිරූපාදිං කාරයෙය්‍යවා
භිත්වා මාලාදිකං චිත්තං ජාතකාදිං සයංකරෙ

82 අත්තනො, ඝාතනෙ, (තමාවිසින්) තමාමැරීමෙහි; (දුකුලාවේ) ඉත්ථිරූපාදිං, ස්ත්‍රීරූපාදිය; කාරයෙය්‍යවා (තෙමේකෙරේනම් අනුන්ලවා කරවානම්; (දුකුලාවේ) මාලාදිකං, මාලාදිවූ; චිත්තං, විසිතුරුකම්; භිත්වා, තබා; ජාතකාදිං, ජාතකාදිවස්තුව; සයංකරෙ, තෙමේ කෙරේනම්; (දුකුලාවේ)

83 භුඤ්ජන්ත මුට්ඨාපෙන්ත සාලාදිසු නිසීදතො
වුඩ්ඪානම්පන ඔකාසං අදත්වාපි දුක්කටං

83 භුඤ්ජන්තං, අනුභවකරන්නහු; උට්ඨාපෙ, හුනස්නෙන් නගා නම්; (දුකුලාවේ) භත්තසාලාදිසු, භොජනශාලාදිවල්හි; වුඩ්ඪානං, මහල්ලන්ට; ඔකාසම්පන, අවකාසය වනාහි; අදත්වා, නොදී; නිසීදතොවාපි, හිඳිනාහටද, දුක්කටං දුකුලා (වෙ)යි-

84 යානාදිමභිරූහෙය්‍ය කල්ලුකොරතනත්තයං
ආරබ්භද චෙව දෙ අඤ්ඤපරිසායො පලාලනෙ,

84 කල්ලකො, නොගිලන්වූයේ; යානාදිං, යානාදියට; අභිරූහෙය්‍ය, නගිනම්; (දුකුලාවේ) රතනත්තයං ආරබ්භ, රත්නත්‍රය අරභයා; දවෙ, ක්‍රීඩාපිණිස; වදෙ, කියානම්; හෙවත් පරිහාර වසයෙන් කථාකෙරේනම්; (දුකුලාවේ) අඤ්ඤපරිසාය, අන්පිරිස්; උපලාලනෙ, නැලවීමෙහිද; හෙවත් වඤ්චා කථාවෙන් ලොල් කරවීමෙහිද; (දුකුලාවේ.)

85 කායාදිං විවරිත්වාන භික්ඛුනීනං නිදස්සයෙ
ජාතෙවලොකායනාපලිතානඤ්ඤනාය ශණ්හාපයෙය්‍යවා,

85 කායාදිං, කයආදිය; (ආදිශබ්දයෙන් කලවයනිම්හඬාය) විව රිත්වාන, විවෘතකොට; හෙවත් සිවුරු නගා; භික්ඛුනීනං, මෙහෙණි න්ට; නිදස්සයෙ, දක්වානම්; (දුකුලාවේ) ලොකායතං, කාව්‍යනාට කාදි තිරශ්චීනවිද්‍යාව; වාචෙ, කියානම්; නොහොත් උගණිනම්; පලිතං, සුදුකෙස්; ගණ්හෙය්‍යවා, (තෙමේහෝ) ගණීනම්; ගණ්හා පෙය්‍යවා, අනුන්ලවා හෝ ගන්වානම්; (දුකුලාවේ)

86 යත්ථකත්ථචි පෙළායං භුඤ්ජතො පත්තහත්ථකො
වාතපානකවාටං වා පණාමෙ සෝදකම්පිච.

86 යත්ථකත්ථචි, යම්කිසි; පෙළායං, තඹලෝආදියෙන්කළ පාතවු මතෙහති, (තබා) භුඤ්ජතො, අනුභවකරන්නාහට (දුකුලාවේ) පත්තහත්ථකො, පාත්‍රයගත් අත්ඇත්තේ; වාතපානකවාටංවා, ජනෙල් කවුළුහෝ; (වාශබ්දයෙන්) දොරකවුළුහෝ, පණාමෙ, හරිනම්; (දුකුලාවේ) සෝදකම්පිච, දියසහිත ●හෙවත් තෙත් පාත්‍රයද; මතු සම්බන්ධයි—

87 උණ්හෙය්‍ය පටිසාමෙය්‍ය අතිඋණ්හෙය්‍ය වොදකං
ඨපෙය්‍ය භූමියං පත්තං අඩ්ඪෙකවා මඤ්චපීඨකෙ.

87 උණ්හෙය්‍ය, උනුහුම්කෙරේනම්; (දුකුලාවේ) පටිසාමෙය්‍ය, තැන්පත්කෙරේනම්; (දුකුලාවේ) වොදකං, පහවූදියඇති පාත්‍රය; අතිඋණ්හෙය්‍ය, ඉතාඋනුහුම්කෙරේනම්;(දුකුලාවේ) පත්තං, පාත්‍රය; භූමියංවා, බිමහෝ; අඩ්ඪෙකවා, ඇකෙහිහෝ; මඤ්චපීඨකෙවා, ඇඳ පුටුවෙහිහෝ; ඨපෙය්‍ය, තබානම්; (දුකුලාවේ)

88 මිඩ්ඪන්තෙ පරිභණ්ඩන්තෙ පාදෙ ඡත්තෙ ඨපෙය්‍යවා
චලකාදිං ඨපෙ පත්තෙ පත්තෙනවා හත්ථධොවනෙ

88 මිඩ්ඪන්තෙවා, ආලන්දුවසානයෙහිද;පරිභණ්ඩන්තෙවා; පිල් කොලවරද; පාදෙවා, පිටිපයෙහිද, ඡත්තෙවා, ඡත්‍රයෙහිද; ඨපෙය්‍ය වා, තබානම්හෝ (දුකුලාවේ) පත්තෙ, පාත්‍රයෙහි, චලකාදිං, මත්ස්‍ය මාංස කටුඇට ආදිය; ඨපෙ, තබානම්; (දුකුලාවේ) පත්තෙන, පාත්‍රයෙ හි, හත්ථ ධොවනෙවා, අත්සේදීමෙහිද; (දුකුලායි.)

89 පත්තෙන නීහරන්තස්ස උච්ඡිට්ඨමුදකම්පිච
අකප්පියම්පි පත්තංවා පරිභුඤ්ජෙය්‍ය දුක්කටං;

89 උච්ඡිට්ඨංඋදකම්පිච ඉඳුල්දියද; පත්තෙන, පාත්‍රයෙන්; නීහරන්තස්ස, ගෙණයන්නාහට; (දුකුලාවේ) අකප්පියම්පි, අකපවූද; පත්තංවා, පාත්‍රයක්හෝ; පරිභුඤ්ජෙය්‍ය පරිභොගකෙරේනම්; දුක්කටං; (දුකුලාවේ)

90 වදෙජීවාති ඛිපිතෙන සික්ඛති අනාදරො
පරිමණ්ඩලතාදිම්හි සෙඛියෙ දුක්කටං සියා.

90 ඛිපිතෙ, කිඹිස්සකල; ජීවඉති, ජීවත්වෙවයි නොහොත් ජීවත්වෙහිවායි; වදෙ, කියානම්; (දුකුලාවේ) පරිමණ්ඩලතාදිම්හි, පිරිමඬුළු ආදිවූ; සෙඛියෙ, පන්සැත්තෑවක් සෙඛියයෙහි; අනාදරො, අනාදරවූයේ; නසික්ඛති, නොහික්මේනම්; දුක්කටංසියා දුකුලාවේ;

91 යොභණ්ඩාගාරෙ පයුත්තොව භණ්ඩකං
මාතුන පාචිත්තිය මස්සගොපයෙ
දවාය හීනෙනාපි ජාතිආදිනා
වදෙය්‍ය දුබ්භාසිත මුත්තමම්පියො.

## පකිණ්ණක නිද්දෙසො.

— —○— —

91 යො, යම්භික්ෂුවක්තෙම; භණ්ඩගාරෙ, භාණ්ඩාගාරයෙහි; පයුත්තොව, යුක්තවූයේම; මාතුනං, මව්පියන්ගේ; භණ්ඩකං, බඩුවක්; පටිගොපයෙ, තබාරකිනම්, අස්ස, ඔහට; පාචිත්තියං, පචිතිඇවැත් (වෙයි) යො, යම්භික්ෂුවක්තෙම; උත්තමම්පි, උත්තමජාති ඇත්තෙකු මද; අපිශබ්දයෙන් හීනජාති ඇත්තෙකුටද; හීනෙනජාති ආදිනා අපි, හීනජාත්‍යාදියකින්ද; (අපි ශබ්දයෙන්) උත්තමජාත්‍යාදියකින්ද; දවාය, ක්‍රීඩාපිණිස; වදෙය්‍ය, කියානම්; දුබ්භාසිතං, දුර්භාසිත ආපත්තිවේ-

## පකිණ්ණක නිද්දෙසො-ප්‍රකීර්ණක නිර්දෙශයි.

——— ○ ———

92 උපජ්ඣාචෙර වත්තඤ්ච ගමිකාගන්තු කම්පිච
සෙනාසනාදි වත්තඤ්ච කාතබ්බං පියසීලිනා.

92 උපජ්ඣාචෙර වත්තඤ්ච, උපාධ්‍යායවතද ඇදුරුවතද; ගමිකං, ගමිකවතද; ආගන්තුකම්පිච, ආගන්තුකවතද; සෙනාසනාදි වත්තඤ්ච, සෙනසුන් ආදිවතද; (ආදිශබ්දයෙන් භත්තාග්‍ර ගිණිහල් වැසිකිළිවත්) පියසීලිනා, සික්ෂාකාමිභුවිසින්; කාතබ්බං, කළයුත්තේයි.

93 හත්ථපාසෙඨිතො කිඤ්චි ගහිතබ්බං දදෙතිධා
ගහෙතුකාමො ගණ්හෙය්‍ය ද්විධායං සම්පටිග්ගහො.

93 හත්ථපාසෙඨිතො, අත්පසෙහි සිටියාවූ (දෙනුකැමැති) තැනැත්තේ; ගහිතබ්බං, (එක්පුරුෂයකු විසින්) ගතහැකි නොහොත් ඔසවියහැකි වස්තුවක්; තිධා, තුන්ප්‍රකාරයෙකින්; දදෙ, දේනම්; ගහෙතුකාමො, ගනුකැමති භික්ෂුතෙම; ද්විධා, දෙපරිද්දෙකින්; ගණ්හෙය්‍ය, ගන්නේය; අයං, මේ; සම්පටිග්ගහො, මනාවූ පිළිගැන්මයි.

94 සඞ්ඝාටිමුත්තරාසඞ්ගං තථා අන්තරවාසකං
එතං ඉමං අධිට්ඨාමි තථාපච්චුද්ධරාමිති

94 සඞ්ඝාටිං, සඟළසිවුරද; උත්තරාසඞ්ගං, උත්තරාසඟද; තථා, එපරිද්දෙන්; අන්තරවාසකං, අඳනද; එතං ඉමං අධිට්ඨාමි ඉති, එතං අධිට්ඨාමි ඉමං අධිට්ඨාමියි කියාද; තථා, එපරිද්දෙන්, පච්චුද්ධරාමි ඉති, එතං පච්චුද්ධරාමි ඉමං පච්චුද්ධරාමියි කියාද; මතුසම්බන්ධයි-

95 ඉමං ඉමානි එතානි එතම්පිචීවරත්තිවා
පරික්ඛාර චොළානිති තථාපච්චුද්ධරාමිති,

95 අපි, නැවත; ඉමං චීවරං පරික්ඛාරචොළං අධිට්ඨාමි ඉති, ඉමං චීවරං පරික්ඛාරචොළං, අධිට්ඨාමියි කියාද; ඉමානි චීවරානි පරික්ඛාරචොළානි අධිට්ඨාමි ඉති, ඉමානි චීවරානි පරික්ඛාරචොළානි අධිට්ඨාමියි කියාද; එතානි චීවරානි පරික්ඛාරචොළානි අධිට්ඨාමි ඉති එතානි චීවරානි පරික්ඛාරචොළානි අධිට්ඨාමියි කියාද; එතං චීවරං පරික්ඛාරචොළං අධිට්ඨාමි ඉති, එතං චීවරං පරික්ඛාරචොළං අධිට්ඨාමියි කියාද; තථා, එපරිද්දෙන්; පච්චුද්ධරාමි ඉති, ඉමං චීවරං පරික්ඛාරචොළං පච්චුද්ධරාමියි කියාද; ඉමානි චීවරානි පරික්ඛාරචොළානි පච්චුද්ධරාමියි කියාද; එතානි චීවරානි පරික්ඛාරචොළානි පච්චුද්ධරාමියි කියාද; එතං චීවරං පරික්ඛාරචොළං පච්චුද්ධරාමියි කියාද; මතුසම්බන්ධයි.

96 එතං ඉමං අධිට්ඨාමි පත්තං පච්චුද්ධරාමිති
එවං පච්චුද්ධරෙයධිට්ඨෙය චීවරාදිං යථාවිධිං,

96 එතං ඉමං පත්තං අධිට්ඨාමි ඉති, එතං පත්තං අධිට්ඨාමි ඉමං පත්තං අධිට්ඨාමියි කියාද; එතං ඉමං පත්තං පච්චුද්ධරාමි ඉති, එතං පත්තං පච්චුද්ධරාමි ඉමං පත්තං පච්චුද්ධරාමියි කියාද; එවං, මෙසේ; චීවරාදිං, සිවුරු ආදිය; යථාවිධිං, විධිපරිද්දෙන්; පච්චුද්ධරෙ, පච්චුද්ධරණය කරන්නේයි-අධිට්ඨෙය, ඉටන්නේයි;

97 සඤ්චරිත්තං විනාසෙසා සචිත්තා ගරුකානිමා
අචිණ්ණානං පරිණතං හිත්වා නිස්සග්ගියමචිත්තකං,

97 සඤ්චරිත්තං, සඤ්චරිත්ත සඞ්ඝාදිසෙසය; විනා, හැර; සෙසා, සෙස්සු; ගරුකානිමා, සඞ්ඝාදිසෙසහා පාරාජිකාපත්තිහු; සචිත්තා, සචිත්තකායෝයි; අචිණ්ණානං, අචිණ්ණන සික්ඛාපදයද; පරිණතං, (තමහට පිරිනැමීමයයි කියනලද) පරිණතසික්ඛාපදයද; හිත්වා, තබා; නිස්සග්ගියං, (සෙසු) නිසග්ගි (පචිති) අචිත්තකං, අචිත්තකායි.

98 පදසොධම්මං දුවෙසෙය්‍යා ඉත්ථිසාධම්මදෙසනා
දුවෙසෙනා සභානීපි සික්ඛිනං චීවරස්සපි,

98 පදසොධම්මං, පදවශයෙන් බණ කියමනෙහි පනවනලද සික්ඛාවද; දුවෙසෙය්‍යා, සෙය්‍යාවෙහි පනවනලද දෙසික්ඛාවෝද; ඉත්‍ථි යාධම්මදෙසනා, මාගයට බණකීමෙහි පනවනලද සික්ඛාවද; දුවෙ ස නා සනාතිපි, සෙනසුන්හි පනවනලද දෙසික්ඛාවෝද; චීවරස්සසිබ්බා නංඅපි, සිවුරු ගෙන්තම්හි පනවනවනලද සික්ඛාවද;

99 පවාරිතං සුරාපානං පස්සාවසනානිධි ආදිකං
ජොතිනුජ්ජාල නසෙඩව කාපබින්දු මිනාදියං,

99 පවාරිතං, ප්‍රථම පවාරිතයෙහි පනවනලද සික්ඛාවද; සුරා පානං, සුරාපානයෙහි පනවනලද සික්ඛාවද; පස්සාවසනානිධි ආදිකං, සනානිධිආදිවූ සික්ඛාවද; ජොතිනුජ්ජාලනසෙඩව, ගිණිදැල්වීමෙහි පනවනලද සික්ඛාවද; කාපබින්දුමනාදියං, කප්බිඳු නොගැන්මෙහි පනවනලද සික්ඛාවද;

100 ගාමප්පවෙසනඤ්ඤාත පාචිත්තියු අචිත්තකා
පකිණ්ණකෙසු උද්දිස්සකතං හිත්වාසුද්ධ මංසකං,

100 ගාමප්පවෙසනඤ්ඤාතා, ගම්වැදීමෙහි පනවනලද සික්ඛාව අව සන්කොට ඇති; එතෙ, මේ (සතළොස්) සික්ඛාවෝ; පාචිත්තියු, (දෙ අනූ) පචිතින් අතුරෙන්; අචිත්තකා, අචිත්තකයෝයි; (සෙසු පචිති සචිත්තකායි) පකිණ්ණකෙසු, ප්‍රකීර්ණකයන් අතුරෙන්; උද්දිස්සකතං, උද්දිස්සකතනම්වූ සික්ඛාව; හිත්වා, හැර; අසුද්ධමංසකං, සෙසුමස් පිස යෙහි පනවනලද සික්ඛාවද;

101 එකත්ථරණ පාපුරණං එකම්සෙඩවතු වට්ටනං
එකතොභුඤ්ජනඤ්චාපි නච්චගීතාදි සත්තපි,

101 එකත්ථරණපාපුරණං එකත්ථරණපාපුරණනම් සික්ඛාපදද; එකමඤ්චතුවට්ටනං, එක්ඇඳසයනයෙහි පනවනලදසික්ඛාවද; එක තොභුඤ්ජනඤ්චාපි, එක්ව වැළඳීමෙහි පනවනලද සික්ඛාවද; නච්චගීතාදි, නෘත්‍යගීතාදිවූ; සත්තපි, සික්ඛාපද සතද; මතු සම්බන්ධයි.

102 අකායබන්ධනඤ්චාපි පත්තහත්ථකවාටකා
අචිත්තකාඉදං සබ්බංසෙසමෙත්ථ සචිත්තකා,

102 අකායබන්ධනඤ්චාපි, අකායබන්ධන සික්ඛාවද; පත්තහත්ථක වාටකා, පත්තහත්ථක වාටකනම් සික්ඛාවද යන; ඉදංසබ්බං, මේසියළු සික්ඛාසමූහය; අචිත්තකාං, අචිත්තකායි; එත්ථ, මෙහි; සෙසං, සෙසු; සචිත්තකා, සචිත්තකායි.

103 විතික්කමන විඤ්ඤත්තන සවිත්තක මචිත්තකා
පඤ්ඤත්ති ජානනෙනාපි වදන්ති විරියාතථා

103 පඤ්ඤත්තිජානනෙනාපි, ප්‍රඥප්තිය දැනීමෙන්ද; වීතික්කමන චිත්තෙන, ව්‍යතික්‍රමන චිත්තය කාරණකොටගෙණ පැමිණිය යුතුහෙයින්; සචිත්තකං, සචිත්තකයයිද; තථා, එපරිද්දෙන්; පඤ්ඤත්තිජානනෙනාපි, ප්‍රඥප්තිය දැනීමෙන්ද; නොදැනීමෙන්ද; වීතික්කමන චිත්තෙන, ව්‍යතික්‍රමන චිත්තය කාරණකොට ගෙණ නොපැමිණිය යුතු හෙයින්; අචිත්තකං, අචිත්තකයයිද; ආචරියා, ආචාර්‍ය්‍යයෝ; වදන්ති, කියත්;

104 පුබ්බකරණාදිකං කත්වා උපොසථ පවාරණං
නවධාදීපිතං සබ්බං කාතබ්බං පියසීලිනා.

104 පුබ්බකරණාදිකං, පූර්ව කාරණාදිය; (ආදිශබ්දයෙන් පූර්ව කෘත්‍ය) කත්වා, කොට; නවධා, නවප්‍රකාරයෙන්; දීපිතං, ප්‍රකාශකළ; සබ්බං, සියළු; උපොසථ පවාරණං, පොහොපවුරුණු; පියසීලිනා, ශික්ෂාකාමීහු විසින්; කාතබ්බං, කළයුත්තේයි.

105 පුබ්බකරණ පුබ්බකිච්චානි සමාපෙත්වා දෙසිතා
පත්තිකස්ස සමග්ගස්ස භික්ඛුසඞ්ඝස්ස අනුමතියා
පාතිමොක්ඛං උද්දිසිතුං ආරාධනං කරොමි.

105 පුබ්බකරණපුබ්බකිච්චානි, පූර්වකරණ පූර්වකෘත්‍යයන්; සමාපෙත්වා, සමාප්තකොට; දෙසිතාපත්තිකස්ස, දෙසනලද ඇවැත්ඇත්තාවූ; සමග්ගස්ස භික්ඛුසඞ්ඝස්ස, සමගිවූ භික්ෂුසඞ්ඝයාගේ; අනුමතියා, කැමැත්තෙන්; පාතිමොක්ඛං, ප්‍රාතිමොක්ෂය; උද්දිසිතුං, උදෙසන්ට, ආරාධනං කරොමි, ආරාධනා කරමි.

106 පාරිසුද්ධි අධිට්ඨාන සුත්තුද්දෙස වසාතිධා
ගණපුග්ගල සඞ්ඝාව තං කරෙය්‍ය යථාක්කමං.

103 පාරිසුද්ධි, පිරිසිදු පොහොයද; අධිට්ඨාන, ඉටන්පොහොසද; සුත්තුද්දෙස, පාමොක් උදෙසන පොහොයද; වසා, (යනමොවුන්ගේ) වසයෙන්; තිධා, (උපොසථය) තුන්පරිද්දෙකින්වේ; තං, ඒ උපොසථය; ගණපුග්ගලසඞ්ඝාව, ගණයාද පුද්ගලයාද සඞ්ඝයාද; යථාක්කමං, ක්‍රමය නොයික්ම; පෙළවත් පිළිවෙලින්; කරෙය්‍ය, කරන්නේය.

107 චාතුද්දසො පණ්ණරසො සාමග්ගී දිනතොතිධා
දිනපුග්ගල කත්තබ්බා කාරතොතෙන වෙරිතා,

107 චාතුද්දසො, තුදුස්වක්පොහොය; පණ්ණරසො, පසළොස්වක්පොහොය; සාමග්ගී, සමගිපොහොය; (යි) දිනතො, දවස් විසින්; තිධා, තුන්පරිද්දෙකින්වේ; දිනපුග්ගල කත්තබ්බකාරතො, දවස්පු

ද්ගල කටයුතු ආකාරයෙන්; තෙ ඒ උපෝසථවිභාගයෝ; නව, නවයෙකැයි; ඊරිතා, කියනලදහ.

108 තයො තයොති කත්වාන දිනපුග්ගලභෙදතො
තෙවාචිචෙකවාචීති නවවුත්තා පවාරණා,
අපිච, අපරොනයො වෙදිතබ්බා.

108 දිනපුග්ගල භෙදතො, දවස්පුද්ගල භෙදයෙන්; තයොත යො ඉති, තුනෙක් තුනෙක්යයි; කත්වාන, කොට; තෙවාචිචෙ කවාචීති, තෙවාචිකා පවුරුණුය, වෙවාචිකා පවුරුණුය; එකවාචිකා පවුරුණුයයිද; නවපවාරණා, නවපවාරණයෝ; වුත්තා, කියනලදහ; අපිච, නවද; අපරොණයො, අනාක්‍රමයෙක් තෙම; වෙදිතබ්බා, දතයුක්තේයි.

109 කත්තිකානන්ති මපක්ඛමහා හෙමං එගගුණ පුණ්ණමා
තස්සඅනන්ති මපක්ඛමහා ගිමහං ආසළ්හිපුණ්ණමා
වස්සකාලං තතොසෙසං චතුවීසතුපොසථා

109 කත්තිකානන්ති මපක්ඛමහා, (පශ්චිමකාර්තික හෙවත්; ඉල් මස අවපෑලවිය පටන්; එගගුණ පුණ්ණමා, මැදිනමස මැදි පොහොය දක්වා; හෙමං,හෙමන්තසෘතුනම් තස්ස, ඒමැදින මාස යාගේ; අන්තිමපක්ඛමහා, අන්තිම පක්ෂය හෙවත් අවපෑල විය පටන්; ආසළ්හිපුණ්ණමා, ඇසලමැදිපෝය දක්වා; ගිමහං, ගිම්හාන සෘතුනම්; තතො, ඒ සෘතුදෙකින්; සෙසං, අවසෙසය; නොහොත් ඇසළමස අවපෑළවිය පටන් පශ්චිම කාර්තික හෙවත් ඉල්මස මැදිපොහොය දක්වා; වස්සකාලං, වස්සාන සෘතුනම්; චතුවීසති උපොසථා, (එකෙකි සෘතුවෙක්හි පොහො අටක් අටක්යයි) සූවිස්සක් උපොසථයෝවෙත්.

110 චාතුද්දසා ඡ එතෙසු පක්ඛාතතිය සත්තමා
සෙසාපණ්ණරසා ඤෙය්‍යා අට්ඨාරස උපො ථා

110 එතෙසු, මේතුන් සෘතුන් අතුරෙන්; නොහොත් මේඋපෞ සථයන් අතුරෙන්; තතියසත්තමාපක්ඛා, එකෙකි සෘතුවෙක්හි තුන්වෙනි සත්වෙනි පක්ෂයෝ; ඡ, සදෙක; චාතුද්දසා, තුදුස්වක් හුයි. සෙස, එසු; අට්ඨාරස උපොසථා, අටළොස් උපෝසථයෝ; පණ්ණරසා, පණ්ණරසීහුයයි; ඤෙය්‍යා, දතයුතුහුයි.

111 ඡන්දං දමමි ඡන්දං මෙහරඡන්දං
මෙ ආරොචෙහීති ඡන්දං දාතබ්බං

111 ඡන්දං දමමිඡන්දං මෙහරඡන්දං මෙ ආරොචෙහි ඉති, ඡන්දං

දම්මිඡන්දං මෙහරඡන්දං මෙ ආරොචෙහි, යි කියා; ඡන්දං, ඡන්දය හෙවත් කැමැත්ත; දාතබ්බං, දියයුක්තේයි *

112 පාරිසුද්ධිං දම්මිපාරිසුද්ධිං මෙහර පාරිසුද්ධිං
මෙආරොචෙහීති පාරිසුද්ධි දාතබ්බා.

112 පාරිසුද්ධිං දම්මි පාරිසුද්ධිං මෙහරපාරිසුද්ධිං මෙආරොචෙහීති, පාරිසුද්ධිං දම්මිපාරිසුද්ධිං මෙ හරපාරිසුද්ධිං මෙ ආරොචෙහි,යි කියා පාරිසුද්ධි, පාරිසුද්ධිතොමෝ; දාතබ්බා, දියයුත්තීය. ×

113 පවාරණං දම්මිපවාරණං මෙහෙරපවාරණං
මෙආරොචෙහි මමත්ථාය පවාරෙහීති පවාරණා දාතබ්බා

113 පවාරණං දම්මි පවාරණංමෙහර පවාරණං මෙආරොචෙහි මමත්ථාය පවාරෙහි ඉති, පවාරණං දම්මිපවාරණං මෙහර පවාරණං මෙ ආරොචෙහි මමත්ථාය පවාරෙහි, යී කියා; පවාරණා, පවුරුණු තොමෝ; දාතබ්බං, දියයුත්තීය. +

114 ආපත්තිදෙසකෙන අහමභන්තෙ සම්බහුලා නානාව
ත්ථුකා ආපත්තියො ආපජ්ජිං තා තුම්හමූලෙ පටිදෙසෙ
මීති වත්වා පස්සසි ආවුසො තා ආපත්තියොති පටිග්ග
ණ්හන්තෙන වුත්තෙ ආමභන්තෙ පස්සාමීති වත්වා පුන
පටිග්ගණ්හන්තෙන ආයතිං, ආවුසො සංවරෙය්‍යාසීති
වුත්තෙ, සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමීති තික්ඛත්තුං
වත්වා දෙසෙතබ්බා.

114 ආපත්තිදෙසකෙන, ඇවැත් දෙසන්නහු විසින්; අහම්භන්තෙ සම්බහුලා නානාවත්ථුකා ආපත්තියො ආපජ්ජිං තා තුම්හමූලෙ පටිදෙසෙමීති ඉති, අහම්භන්තෙ සම්බහුලා නානාවත්ථුකා ආපත්තියො ආපජ්ජිං තා තුම්හමූලෙ පටිදෙසෙමි, යී; වත්වා, කියා; පස්සසි ආවුසො තා ආපත්තියො, යී; පටිග්ගණ්හ

---

* ඡන්දං, කැමැත්ත; දම්මි,දෙමි;මෙ. මාගේ; ඡන්දං, කැමැත්ත; හර, ගෙණයව;මෙ, මාගේ; ඡන්දං,කැමැත්ත; ආරොචෙහි, කියව; යනු මෙහි අර්ථයි.

× පාරිසුද්ධි, පිරිසිදු; දම්මි, දෙමි; මෙ, මාගේ; පාරිසුද්ධිං, පිරිසිදුබව; හර, ගෙණයව; මෙ, මාගේ; පාරිසුද්ධිං, පිරිසිදුබව; ආරොචෙහි, කියව; යනු මෙහි අර්ථයි.

\+ පවාරණං, පවුරුණු; දම්මි, දෙමි; මෙ, මාගේ;පවාරණං; පවුරුණු; හර, ගෙණයව; මෙ, මාගේ; පවාරණං, පවුරුණු; ආරොචෙසි, කියව; මමත්ථාය, මාපිණිස; පවාරෙහි, පවරව; යනු, මෙහි අර්ථයි.

න්තෙන, පිළිගන්නහු විසින්; වුත්තෙ, කීකල්හි; ආම භන්තෙ පස්සාමි ඉති, ආම භන්තෙ පස්සාමි, යී; වත්වා, කියා; පුන, නැවත; පටිග්ගණ්හන්තෙන, පිළිගන්නහු විසින්; ආයතිං ආවුසො සංවරෙය්‍යාසීති, ආයතිං ආවුසො සංවරෙය්‍යාසි, යී, වුත්තෙ, කීකල්හි; සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමි ඉති, සාධුසුට්ඨුභන්තෙ සංවරිස්සමි, යි; තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; දෙසෙතබ්බා, දෙසියයුතුකානීය. *

115 විමතිං × ආරොචෙන්තෙන—අහං භන්තෙ සම්බහුලාසු
නානා වත්ථුකාසු අපත්තීසු වෙමතිකො යදා
නිබ්බෙමතිකො භවිස්සාමි තදා තා ආපත්තියො
පටිකරිස්සාමීති තික්ඛත්තුං වත්වා ආරොචෙතබ්බා,

125 විමතිං විමතිය; ආරොචෙන්තෙන, කියන්නහු විසින්; අහං භන්තෙ සම්බහුලාසු නානාවත්ථුකාසු ආපත්තීසු වෙමතිකො යදා නිබ්බෙමතිකො භවිස්සාමි තදා තා ආපත්තියො පටිකරිස්සාමි ඉති, අහං භන්තෙ සම්බහුලාසු නානාවත්ථුකාසු ආපත්තීසු වෙමතිකො යදා නිබ්බෙමතිකො භවිස්සාමි තදා තා ආපත්තියො පටිකරිස්සාමි ,යී තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; ආරොචෙතබ්බා, ආරොචනය කළයුතුකානීය. †

---

* භන්තෙ, ස්වාමිය; අහං, මම; සම්බහුලා, බොහෝ; නානාවත්ථුකා, නොයෙක් වස්තුඇත්තාවූ; ආපත්තියො, ආපත්තීන්ට; ආපජ්ජිං, පැමිණියෙමි, තා, ඒ ආපත්තීන්; තුම්හමූලෙ, තොප කෙරෙහි; පටිදෙසෙමි ඉති, දෙසමියි හෝ නොහොත් ප්‍රකාශ කෙරෙමියි; වත්වා, කියා; පටිග්ගණ්හන්තෙන, පිළිගන්නහු විසින්; ආවුසො, ඇවැත; තා ආපත්තියො, ඒ ආපත්තීන්; පස්සසි ඉති, දක්නෙහිදැයි; වුත්තෙ, කීකල්හි; භන්තෙ, ස්වාමිය; ආම, එසේයි; පස්සාමීති, දකිමියි; වත්වා, කියා; පුන, නැවත; පටිග්ගණ්හන්තෙන; පිළිගන්නහු විසින්; ආවුසො, ඇවත: ආයතිං, මත්තෙහි, සංවරෙය්‍යාසීති, සංවරයෙහි සිටුවයි; වුත්තෙ, කීකල්හි; භන්තෙ, ස්වාමිය; සාධු, යහපත; සුට්ඨු, මනාකොට; සංවරිස්සාමීති, සංවරයෙහි සිටින්නෙමියි; තික්ඛත්තුං වත්වා, තුන්යලක් කියා; දෙසෙතබ්බා, දෙසියයුක්තීය; යනු මෙහි අර්ථයි.

× වෙමති, යී ද තිබේ.

† භන්තෙ, වහන්ස; අහං, මම; සම්බහුලාසු, බොහෝවූ; නානාවත්ථුකාසු, නානාවස්තු ඇත්තාවූ, ආපත්තීසු, ආපත්තිවල්හි; වෙමතිකො, විමති ඇත්තෙක්මි; යදා, යම්කලක; නිබ්බෙමතිකො භවිස්සාමි, විමතිනැත්තෙක් වන්නෙම්ද; තදා, එකල්හි තා ආපත්තියො, ඒ ආපත්තීන්; පටිකරිස්සාමි, පහළකරන්නෙමි; යනු මෙහි අර්ථයි.

116 අජ්ජමෙ උපොසථො පණ්ණරසො චාතුද්දසො
තිවා අධිඨාමීති තික්ඛත්තුං වත්වා පුග්ගලෙන
අධිඨානුපොසථො කාතබ්බො,

116 අජ්ජමෙ උපොසථො පණ්ණරසො ඉතිවා, අජ්ජමෙ උපොසථො පණ්ණරසො, යී හෝ; චාතුද්දසො ඉති වා, අජ්ජමෙ උපොසථො චාතුද්දසො, යී හෝ; අධිට්ඨාමිඉති, අධිට්ඨාමි, යී; තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; පුග්ගලෙන, පුද්ගලයා විසින්; අධිඨානුපොසථො, ඉටන් පොහොහොම; කාතබ්බො, කළයුක්තේයි *

117 ද්වීසුපන ථෙරෙන, පරිසුද්ධො අහං ආවුසො පරි
සුද්ධොති මං ධාරෙහීති තික්ඛත්තුං වත්තබ්බං,

117 ද්වීසුපන, දෙදෙනා අතුරෙහි වනාහි; ථෙරෙණ, මහල් ලහු විසින්; පරිසුද්ධො අහං ආවුසො පරිසුද්ධොතිමං ධාරෙහීති, පරිසුද්ධො අහං ආවුසො පරිසුද්ධොති මං ධාරෙහියී; තික්ඛත්තුං, තුන්යලක්; වත්තබ්බං, කියයුක්තේයි ×

118 නවකෙනාපි තථෙව වත්තබ්බං, අහංභන්තෙ
මංධාරෙථාති වචනමෙව විසෙසො,

118 නවකෙනාපි, නවකයා විසිනුදු; තථෙව, එපරිද්දෙන්ම; වත්තබ්බං, යුත්තේයී; අහංභන්තෙ මංධාරෙථාති, අහංභන්තෙ මංධාරෙථ යන; වචනමෙව, වචනයම; විසෙසො, වෙනසි +

119 තීසු පන සුණාතු මෙ ආයස්මන්තා අජ්ජුපොසථො
පණ්ණරසො චාතුද්දසොතිවා, යදායස්මන්තානං පත්තක
ල්ලංමයං අඤ්ඤමඤ්ඤං පාරිසුද්ධි † උපොසථංකරෙය්‍යා
මාති ඤත්තිං ඨපෙත්වා පටිපාටියාවුත්ත නයෙනෙව
පාරිසුද්ධි උපොසථො කාතබ්බො.

119 තීසුපන, තුන්දෙනා අතුරෙහි වනාහි; සුණාතු මෙ ආයස්මන්තා අජ්ජුපොසථො පණ්ණරසො ඉතිවා, සුණාතු මෙ

---

* අජ්ජ, අද; මෙ, මාගේ; උපොසථො, පොහොහොම; පණ්ණරසො, පසළොස්වක් වන්නේය නොහොත්; චාතුද්දසො, තුදුස්වක් වන්නේය; අධිඨාමි, (එය) ඉටමි; යනු මෙහි අර්ථයි.

× ආවුසො, ඇවත; අහං, මම; පරිසුද්ධො, පිරිසිදුයෙමි; පරිසුද්ධොති, පිරිසිදුයයි; මං, මා; ධාරෙහි, දරව; සලකාව; යනු මෙහි අර්ථයි.

+ අහංභන්තෙ මංධාරෙථාති, වචනමෙව විසෙසොයයි කියන ලද බැවින්; පරිසුද්ධො අහංභන්තෙ පරිසුද්ධොති මංධාරෙථ, යී කියයුතු.

† පාරිසුද්ධිංයී, සමහර.

ආයස්මන්තො අජ්ජ පොසථො පණ්ණරසො,යි කියා හෝ; චාතුද්දසො ඉතිවා, සුණාතුමෙ ආයස්මන්තො අජ්ජ පොසථො චාතුද්දසො,යි කියා හෝ; යදායස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පාරිසුද්ධි උපොසථං කාරෙය්‍යාමාති, යදායස්මන්තානං පත්තකල්ලංමයං අඤ්ඤමඤ්ඤං පාරිසුද්ධි උපොසථං කරෙය්‍යාම, යි ඤත්තිං, ඤත්තිය; ඨපෙත්වා, තබා; පටිපාටියා, (මහළු) පිළිවෙලින්; වුත්තනයෙනෙව, යට කියනලද ක්‍රමයෙන්ම; පාරිසුද්ධි උපොසථො; පිරිසිදු පොහොනෙමේ; කාතබ්බො, කළයුක්තේයි. *

120 අජ්ජමෙපවාරණා පණ්ණරසී චාතුද්දසීතිවා
අභික්කාමීති තික්ඛත්තුං වත්වා එකෙන පවාරෙතබ්බං

120 අජ්ජ මෙ පවාරණා පණ්ණරසී ඉතිවා, අජ්ජමෙ පවාරණා පණ්ණරසීයයි කියා හෝ; චාතුද්දසී ඉතිවා, අජ්ජමෙ පවාරණා චාතුද්දසීයයි කියා හෝ; අභික්කාමිති, අභික්කාමියි; තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; එකෙන, එකනමක් විසින්; පවාරෙතබ්බං, පැවරිය යුතුයි. +

121 වීසුපනථෙරෙන, අහං ආවුසො ආයස්මන්තං පවාරෙමි
දිට්ඨෙනවා සුතෙනවා පරිසඞ්කායවාවදන්තුමං ආයස්මා
අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමි තික්ඛ
ත්තුං වත්වා පවාරෙතබ්බං.

121 වීසුපන, දෙදෙනා අතුරෙහි වනාහි; ථෙරෙණ, මහල්ලහු විසින්; අහං ආවුසො ආයස්මන්තං පවාරෙමි දිට්ඨෙනවා සුතෙනවා පරිසඞ්කායවාවදන්තුමං ආයස්මාඅනුකම්පං උපාදායපස්සන්තො පටිකරිස්සාමි ඉති, අහං ආවුසො ආයස්මන්තං පවාරෙමි දිට්ඨෙනවා සුතෙනවා පරිසඞ්කායවා වදන්තුමං ආයස්මා අනුකම්පං

---

* ආයස්මන්තො; ආයුෂ්මත්හු; මෙ,මාකියන්නක්; සුණාතු, අසත්වා; අජ්ජ පොසථො, අද පොහොනෙම; පණ්ණරසො, පණ්ණරසීවෙයි; වා, නොහොත්; චාතුද්දසොති, චාතුර්දශීවෙයි; යදි, ඉදින්; ආයස්මන්තානං, ආයුෂ්මතුන්ට; පත්තකල්ලං, පැමිණිකල් ඇත්තේනම්; මයං, අපි; අඤ්ඤමඤ්ඤං, අන්‍යොන්‍යයාට; පාරිසුද්ධි උපොසථං, පිරිසිදු පොහොය; කාරෙය්‍යා, කරන්නෙමු; යනු මෙහි අර්ථයි.

\+ අජ්ජ, අද; මෙ, මාගේ; පවාරණා, පවුරුණු නොමෙ?; පණ්ණරසී, පණ්ණරසීය නොහොත්; චාතුද්දසී, තුදුස්වක්ය; අභික්කාමි, (එය) ඉටමි; යනු මෙහි අර්ථයි.

උපාදාය පස්සන්තො පටිකරිස්සාමි; යී තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; පවාරෙතබ්බං, පැවරියයුතු. *

122 නවකෙනාපි තථෙව වත්තබ්බං
භන්තෙති වචනමෙව විසෙසො,

122 නවකෙනාපි, නවකයා විසිනුදු; තථෙව, එසේම; වත්ත බ්බං, කියයුතුය; භන්තෙ ඉති, භන්තෙයන; වචනමෙව, වචන යම; විසෙසො, වෙනසි ×

123 තිසුවාචතුසුවාපන, සුණන්තු මෙ ආයස්මන්තො, අජ්ජ පවාරණා පණ්ණරසී චාතුද්දසීතිවා යදායස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාම’ති ඤත්තිං ඨපෙත්වා ථෙරෙණ අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙනවා සුතෙනවා පරි සඞ්කායවා වදන්තුමං ආයස්මන්තො අනුකම්පං උපාදාය පස්ස න්තො පටිකරිස්සාමීති තික්ඛත්තුං වත්වා පවාරෙතබ්බං.

123 තීසුවාචතුසුවාපන, තුන්දෙනා අතුරෙහි හෝ සතර දෙනා අතුරෙහි හෝ වනාහි; සුණන්තු මෙ ආයස්මන්තො අජ්ජ පවාරණා පණ්ණරසී ඉතිවා, සුණන්තු මෙ ආයස්මන්තො අජ්ජ පවාරණා පණ්ණරසී,යී කියා හෝ, චාතුද්දසීතිවා, සුණන්තු මෙ ආයස්මන්තො අජ්ජපවාරණා චාතුද්දසී,යී කියා හෝ; යදායස්ම න්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාම ඉති,යදා යස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාම,යී; ඤත්තිං ඨපෙත්වා, ඤත්තියතබා; ථෙරෙණ, වැඩිමලලහු විසින්; අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි, දිට්ඨෙනවා සුතෙනවා පරි සඞ්කායවා වදන්තුමං ආයස්මන්තො අනුකම්පං උපාදාය පස්ස න්තො පටිකරිස්සාමි ඉති, අහං ආවුසො ආයස්මන්තො පවාරෙමි දිට්ඨෙනවා සුතෙනවා පරිසඞ්කායවා වදන්තුමං ආයස්මන්තො

---

* ආවුසො, ඇවැත; අහං, මම; ආයස්මන්තං, ආයුෂ්මත්හට; පවාරෙමි, පවරමි; ආයස්මා, ආයුස්මත්තෙම; අනුකම්පං උපාදාය, කරුණාව පිණිස; දිට්ඨෙනවා, දුටුදෙයකින් හෝ; සුතෙනවා, ඇසූ දෙයකින්හෝ; පරිසඞ්කායවා, සැකකළදෙයකින් හෝ; මං, මට; වදතු, කියාවා; පස්සන්තො, දක්නෙම්; පටිකරිස්සාමි, පැමිණි ඇවැත් පහළකරන්නෙම්; යනු මෙහි අර්ථයි.

× භන්තෙති වචනමෙව විසෙසො, යී කියනලද බැවින්; අහම්භන්තෙ ආයස්මන්තං පවාරෙමි, දිට්ඨෙනවා සුතෙනවා පරි සඞ්කායවා වදතුමං භන්තෙ අනුකම්පං උපාදාය පස්සන්තො පටි කරිස්සාමි,යී තුන්යලක් කිණියයුතුවේ.

අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමි සී; තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; පවාරෙතබ්බං, පැවරියයුතු –*

124 නවකෙහිපි, තථෙවපටිපාටියා පවාරෙතබ්බං
භන්තෙති වචනමෙව විසෙසො.

124 නවකෙහිපි, නවකයන් විසිනුදු; තථෙව, එපරිද්දෙන්; පටිපාටියා, පිළිවෙළින්; පවාරෙතබ්බං, පැවරියයුතු; භන්තෙඉති, භන්තෙයන; වචනමෙව, වචනයම; විසෙසො, වෙනසි.

125 චතූහි අධිකෙසුපන, සුණාතු මෙ ආවුසො සඞ්ඝො අජ්ජ
පවාරණා පණ්ණරසී චාතුද්දසීතිවා යදිසඞ්ඝස්ස පත්ත
කල්ලං සඞ්ඝො පවාරෙය්‍යාති ඤත්තිං ඨපෙත්වා, වුඩ්ඪ
තරෙණසඞ්ඝං ආවුසො පවාරෙමි දිට්ඨෙනවා සුතෙනවා
පරිසඞ්කායවා වදන්තුමං සඞ්ඝො අනුකම්පං උපාදාය
පස්සන්තො පටිකරිස්සාමීති තික්ඛත්තුං වත්වා පවාරෙ
තබ්බං.

225 චතූහි, සතරදෙනකුගෙන්; අධිකෙසුපන, අධිකයන් අතුරෙහි වනාහි; සුණාතු මෙ ආවුසො සඞ්ඝො අජ්ජපවාරණා පණ්ණරසී ඉතිවා, සුණාතුමෙ ආවුසො සඞ්ඝො අජ්ජපවාරණා පණ්ණරසීය යි කියා හෝ; චාතුද්දසී ඉතිවා, සුණාතුමෙ ආවුසො සඞ්ඝො අජ්ජපවාරණා චාතුද්දසියයි කියා හෝ; යදිසඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝොපවාරෙය්‍යායි, යදිසඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝොපවාරෙය්‍යයි; ඤත්තිං ඨපෙත්වා, ඤත්තියතබා; වුඩ්ඪතරෙන, වැඩිමහල්ලා විසින්; සඞ්ඝංආවුසො පවාරෙමි දිට්ඨෙනවා සුතෙනවා පරිසඞ්කායවා වදන්තුමං සඞ්ඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමිඉති, සඞ්ඝං ආවුසොපවාරෙමි දිට්ඨෙනවා සුතෙනවා පරිසඞ්කායවා වදන්තුමං සඞ්ඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමියි; තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; පවාරෙතබ්බං, පැවැරියයුතුයි. ×

---

* ආයස්මන්තො, ආයුෂ්මත්හු; මෙ, මාකියන්නක්; සුණන්තු, අසත්වා; අජ්ජ, අද; පවාරණා, පවුරුණුතොමෝ; පණ්ණරසී, පණ්ණරසීය; නොහොත්, චාතුද්දසී, තුදුස්වක්ය; යදි, ඉදින්; ආයස්මන්තානං, ආයුෂ්මතුන්ට; පත්තකල්ලං, පැමිණිකල් ඇත්තේ නම්; මයං, අපි; අඤ්ඤමඤ්ඤං, අනෙකානෙකාට; පවාරෙය්‍යාම, පවරම්හ; සෙසය යටකියනලද නයින් දතයුතු.

× ආවුසො, ඇවත; සඞ්ඝො, සඞ්ඝතෙම; මෙ, මාකියන්නක්; සුණාතු, අසාවා; අජ්ජ, අද; පවාරණා, පවුරුණු; පණ්ණරසීවන්නීය නොහොත්; චාතුද්දසී, තුදුස්වක්වන්නීය; යදි,

126 නවකොහිපි තථෙව පටිපාටියා සඞ්ඝම්භන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසංකාය වා වදන්තු මං සඞ්ඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමීති තික්ඛත්තුං වත්වා පවාරෙතබ්බං

වත්තාදිකණ්ඩො-මූලසික්ඛා නිට්ඨිතා.

---

126 නවකොහිපි, නවකයන් විසිනුදු; තථෙව, එසේම; පටිපාටියා, පිළිවෙළින්; සඞ්ඝම්භන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදන්තු මං සඞ්ඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමි ඉති, සඞ්ඝම්භන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසංකාය වා වදන්තු මං සඞ්ඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමීති තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; පවාරෙතබ්බං, පැවරිය යුත්තේයි.-*

වත්තාදිකණ්ඩො, වත් ආදිකාණ්ඩයයි-


මූලසික්ඛා, මූලශික්ෂාතොමෝ, නිට්ඨිතා, නිමකරණලදී

---

ඉඳින්; සඞ්ඝස්ස. සඞ්ඝයාහට; පත්තකල්ලං, පැමිණිකල් ඇත්තේ නම් සඞ්ඝො,සඞ්ඝතෙම; පවාරෙය්‍ය,පවරන්නේය; සෙස්ස යටකී නයයි; සඞ්ඝං යනු පමණක් වෙනසි; සඞ්ඝයාට යනු එහි අර්ථයි.

* භන්තෙ, වහන්ස; සඞ්ඝං, සඞ්ඝයාට; පවාරෙමි, පවරමි යනු අර්ථයි-සෙස්ස යටකී නයයි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු